# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| **ස්ථානය** | : | **බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව** |
| **දිනය** | : | 2015-01-29 |
| **වේලාව** | : | පෙ.ව. 10.00 |

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. | නගර සභා ගරු මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 4. | නගර සභා ගරු මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. | නගර සභා ගරු මන්ත්‍රී | එම්.ටී.එම්.රුමි මැතිතුමා |
| 6. | නගර සභා ගරු මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. | නගර සභා ගරු මන්ත්‍රී | ඒ.අසංක විජය නිල්මිණි මැතිතුමා |
| 8. | නගර සභා ගරු මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 9. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීම:

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු නාගරික මන්ත්‍රි ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

කියැවූ ලෙස සලකා එම වාර්තාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 03. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

මෙදින සභාවේදි සමාලෝචන ඉදිරිපත් නොවිනි.

## 04. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

මෙදින මහා සභා රැස්වීමට පැමිණ සිටි ගරු උප සභාපතිතුමන්, නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ මාධ්‍යවේදීන් ඇතුළු සියළුම දෙනා ගරු සභාපතිතුමන් විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

දීර්ඝ කාලයකට පසු පැවති ජනපතිවරණයෙන් අතිගරු ජනාධිපති හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති ලෙස ක්‍රියා කල මහින්ද රාජපක්ෂ මැතිතුමා පරාජය කරමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු ලේකම් ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා,පොදු අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වී ජයග්‍රහණය කිරීම සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කල ගරු සභාපතිතුමා, නව ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ,ජනාධිපතිවරයා වශයෙන් රටට අවශ්‍ය සාමය, සංවර්ධනය හා ජනතා අවශ්‍යතාවයන් ඉටුකිරීමට හැකිවේවායි සුභ ප්‍රාර්ථනා කරන බව පවසන ලදී.

තවදුරටත් අදහස් ඉදිරිපත් කරමින් ගරු සභාපතිතුමා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව අගමැතිතුමා සතුව වැඩි බහුතර මන්ත්‍රී පිරිසක් සිටීම අවශ්‍ය නමුත් ජනතා අවශ්‍යතා ඉටුකිරිම සඳහා නව රජය මගින් ප්‍රකාශිත දින 100 වැඩසටහන සදහා සහයෝගය ලබාදෙන බවත්,නව අග්‍රාමාත්‍ය ලෙස පත්වූ රනිල් වික්‍රමසිංහ මැතිතුමාට හා නව අමාත්‍ය මණ්ඩලයට දින 100 කාර්යයන් සාර්ථකව සිදුකරගෙන යෑමට හැකියාව ලැබේවායි සුභප්‍රාර්ථනා කරන බවත් පැවසීය.

එමෙන්ම දැයට කිරුළ වැඩසටහන ඔස්සේ හිටපු ජනාධිපතිතුමා විසින් ප්‍රදේශයේ සංවර්ධනය සඳහා කෝටි 10ක මුදලක් වෙන් කර තිබූ මොහොතක පත්වූ නව ජනාධිපතිවරයා සමග එම කටයුතු ඉදිරියට කෙසේ සිදුවේදැයි තවමත් නොදන්නා බව පැවසූ ගරු සභාපතිතුමා ඒ සඳහා ප්‍රතිපාදන ලද හොත් සංවර්ධන කාර්යයන් දිගටම කරගෙන යාමට අපේක්ෂා කරන බවත් පැවසීය.

එසේම නවරජය විසින් මාර්ග සංවර්ධන අමාත්‍යාංශය හරහා ලිපියක් මගින් දන්වා තිබෙන පරිදි, සංවර්ධන කටයුතු වෙනුවෙන් එක් මංත්‍රීවරයෙක් සඳහා රුපියල් ලක්ෂ 10ක මුදලක් ලබාදීමට ක්‍රියාකරන බවත් අප්‍රේල් මාසය වන විට එම කාර්යයන් නිම කිරීමට අපේක්ෂාවක් ඇති බවත් පවසා ඇති හෙයින්,කඩිනමින් එම සංවර්ධන යෝජනා ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී.එමෙන්ම ජනතාවට සේවය කිරීම සඳහා පක්ෂ පාට අවශ්‍ය නැති බවත්, මූලික අපේක්ෂාව ජනතා සේවය බවත්,මේ වන විට ජනතා පැතුම වී ඇත්තේද ජාතික ආණ්ඩුවක් බව පැවසූ ගරු සභාපතිතුමා,සංවර්ධන කටයුතු ඉදිරියට ගෙන යමින්,ජනතාවට දුන් පොරොන්දු සියල්ල ඉෂ්ට සිද්ධ කරලීමට අවශ්‍ය ශක්තිය සියල්ලන්ටම ලැබේවායි පැතූ ගරු සභාපතිතුමා ගරු සභාවේ කාර්යයන් සාර්ථක ලෙස සිදු කර ගෙන යාමට අවශ්‍ය සහය ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

එමෙන්ම ,සියළු පළාත් පාලන ආයතනවල පවතින ගැටළු එක්රැස් කර විසදුම් ලබා ගැනීම සඳහා ජනාධිපතිවරයා වෙත යොමුකිරීමේ අරමුණින් සියළු පළාත් පාලන ආයතනයන් එක්ව පිහිටුවා ගෙන ඇති පළාත් පාලන සංසදයේ සභාපතීත්වයට මෙවර තමා පත් කර ගෙන ඇති බවත්, කුමන රජයක් බලයේ සිටියද එම සභාපතීත්වය වසර 2ක ධූර කාලයකට යටත් බවත් පැවසූ ගරු සභාපතිතුමා ඒ ධූරයට තමන් යෝජනා කර ගනිමින් ස්ථිර කර ගත්,අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමාටත්,මහරගම නගර සභාවේ ගරු සභාපතිතුමියටත්,පළාත් පාලන සංසදයේ සියළු සාමාජිකයන්ටත් ස්තුති කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බව පවසමින් එම තනතුර භාර ගන්නා බවට අද දින දන්වා යවන බවත් පවසන ලදි. වැඩි වූ මන්ත්‍රී දීමනාව, පළාත් පාලන ආයතනයන් වෙත අළුතින් ලැබුන වාහන වැනි ,මෙම සංසදය මගින් ලබාගත් දේ බොහෝ බවත් ඉදිරියටත් සියළු කටයුතු සාර්ථකව සිදුකරගෙන යාමට අපේක්ෂා කරන බවත් පැවසූ ගරු සභාපතිතුමා නිවේදන ප්‍රකාශ කිරීම අවසන් කරන ලදී.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය හා කර්මාන්ත ප්‍රගතිය ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්.රූම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 කඩ කාමරවල තක්සේරු කල මාසික කුලිය ක්‍රියාත්මක කර ගැනීම.

කඩ කාමරවල කුළිය තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් කරන ලද ඉල්ලීම අනුව,කාර්පාක් කඩ කාමරවල තක්සේරු වටිනාකම දන්වා එවා ඇති බවත්,මේ සම්බන්ධව ක්‍රියාත්මක වීම සම්බන්දව සාකච්ඡා කොට තීරණයක් ගැනීම සඳහා සභාව වෙත ඉදිරිපත් කර තිබූ ලිපිය පිළිබඳ අදහස් දක්වමින් ගරු සභාපතිතුමා විසින් කඩ කාමර කඩා වැටීම හා සංවර්ධනය අඩාළ වීම නිසා, තක්සේරු කරන ලද මිල ගණන් ලබන වසරේ සිට ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලදී.

මෙහිදී අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රි ධර්මසේන සමරසිංහ මැතිතුමා බස් නැවතුම්පොළට පිවිසෙන මාර්ගයේ ඇති ටකරන් කඩ පේලිය නිසා බස්නැවතුම්පොලේ පවතින කඩ සඳහා ආදායම අඩු වී ඇති බවත් එම කඩ සඳහා දැනට අය කරන කුළිය ප්‍රමාණවත් නොවන බවත්, දිනකට රුපියල් 50ක්ව පවතින කඩ කුළිය රුපියල් 200 දක්වා වැඩිකිරීමටත් යෝජනා කරන ලදි.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රි චමික වැවේගෙදර මැතිතුමා පොදු වෙළෙද සැලේ හා කාර්පාක් කඩ කාමර කුළී වැඩිකිරීම සඳහා තමා යෝජනා නොකල බවත්,ටකරන් කඩ පේළිය පදික වෙළදුන් සඳහා ලබාදෙන බවට නොමග යවමින්,අපිව රවටා ලබාගත් ඒවා බවත් පැවසීය. තවද මෙහිදී අදහස් ප්‍රකාශ කල ගරු නාගරික මන්ත්‍රි අසංක විජය නිල්මිණි මැතිතුමා තම පියාගේ පාලන කාලය තුළ පදික වෙළදුන් සඳහා කඩකාමර ලබාදීම නිසියාකාරව කරගෙන ගිය බවත්,මේවන විට මෙය කුඨ ව්‍යාපාරයක් බවට පත්කර ගෙන සභාපතිතුමාගේ නම පවා භාවිතයට ගෙන සභාවට අගෞරව වෙන පරිදි පවරාදීම් කර ඇති බවත් පැවසීය.

මේ සඳහා පිළිතුරු දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් මිල ගණන් දන්වා එවනතෙක් මිල ගණන් වැඩි කිරීම සිදුකල නොහැකි බවත්,ටකරන් කඩ පේළිය පදික වෙළදුන් සඳහා ලබා දුන් නමුදු කුඩැල්ලා මෙට්ටය උඩ තැබීමට අපහසු මෙන්,ඔවුන්ද වැඩි සෙනගක් ගැවසෙන තැන් බලා නැවත පදික වේදිකාවට යන බැවින් ඔවුනගේ මානසිකත්වය සළකා බලා මාස 3ක කඩකුළී ලබාගෙන, සභාවට ඉදිරිපත් කර, සභා තීරණයක් ගෙන නීති රීතිවලට අනුකුලව සියල්ල සිදුකර ඇති බවත්ය.

මෙහිදී ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා විසින් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් එවන ලද මිල ගණන් ක්‍රියාත්මක නොකිරීම සභාවට ගැටළුවක් වේ දැයි ලේකම්තුමියගෙන් විමසූ අතර සභාවට ලැබිය යුතු ආදායම අහිමිවීම නිසා විගණන ගැටළු ඇතිවිය හැකි බව ඇය විසින් පෙන්වා දෙන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්. ටී. එම්. රූම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:02 රථවාහන නැවතුම් ගාස්තු අඩුකර ගැනීම. තනූජා කුමාරි වීරපුර

2015.01.08 දින පැවති ජනාධිපතිවරණය හේතුකොට ගෙන ජනවාරි 8,9,10 යන තෙදින තුළ රථවාහන නගරයට නොපැමිනීම නිසා මුදල් අයකර ගැනීමට නොහැකි වූ බව පවසා රථ වාහන ටෙන්ඩරයේ මුදල් එම දින 3 සඳහා අඩුකර දෙන මෙන් කර තිබූ ඉල්ලීම් ලිපිය සභාව වෙත ඉදිරිපත් කල ගරු සභාපතිතුමා දින 3ක් සඳහා මුදල් අඩුකිරීමට යෝජනා කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු මන්ත්‍රී චමික වැවේගෙදර මැතිතුමා, රථවාහන නැවතුම් ගාස්තු ටෙන්ඩර් කිරිම මගින් රු.87,000 ක මුදලක් සභාවට ලැබෙන නමුත් රු.178,500 ක පමණ මුදලක් ටෙන්ඩර්කරු අතට යන බැවින් එසේ ගාස්තු අඩුකිරීම අසාධාරණ බවත් ඒ සඳහා විරුද්ධ වන බවත් පැවසීය. මේ පිළිබඳව සභාව වැඩි දුරටත් සාකච්ඡා කර දින 1 1/2 ක මුදල් අඩුකිරීමට සභාව විසින් ගත් තීරණය අනුමත කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:03 පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීමෙන් බැහැරව සිටින බව දැන්වීම.**

2015.01.08 දින පැවති ජනාධිපතිවරණය හේතුකොට ගෙන ජනවාරි 8,9, යන දෙදින තුළ සේවයෙන් බැහැරව සිටිම නිසා පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීමෙන් බැහැරව සිටි බව දන්වා එම්.පී. පියසේන මහතා විසින් සභාව වෙත එවා තිබූ ලිපිය ඉදිරිපත් කල ගරු සභාපතිතුමා පෞද්ගලික බස්රථ ධාවන සටහන් අනුව වාර්තාවක් ලබාගෙන ඒ පිළිබඳව තීරණයක් ගැනීම සුදුසු බව සභාවට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:04 2015-01-15 දින පෞද්ගලික බස් ගාල් ගාස්තු අවම වීම පිළිබදව කරුණු දැක්වීම.**

2015.01.15 දින පැවති තෛයිපොන්ගල් උත්සවය හේතුකොට ගෙන ජනවාරි 15 දින තුළ පෞද්ගලික බස් ධාවනය අවම වූ හෙයින් ගාස්තු අය කිරීම අඩු වූ බව දන්වා එම්.පී. පියසේන මහතා විසින් සභාව වෙත එවා තිබූ ලිපිය ඉදිරිපත් කල ගරු සභාපතිතුමා, පෞද්ගලික බස්රථ ධාවන සටහන් අනුව වාර්තාවක් ලබාගෙන ඒ පිළිබදව ද, තීරණයක් ගැනීම සුදුසු බව සභාවට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:05 කාර්ය සාධන තරගයේ නිර්ණායක අනුව ගබඩාව විධිමත් කර ගැනීම.**

කාර්ය සාධන තරගයේ නිර්ණායක අනුව ගබඩාව විධිමත් කර ගැනීම සඳහා ගබඩා කාමරය තුළ ඇලුමිනියම් හා වීදුරු රාක්ක යොදා ආරක්ෂා සහිතව රාක්ක සකස් කර ගැනීමට අවශ්‍ය බව පවසමින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාව වෙත ඉදිරිපත් කළ ගරු සභාපතිතුමා, මේ සඳහා ඇස්තමේන්තුවක් සකස් කර අදාළ කාර්යයන් සිදු කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:06 සතිපොළ කඩ කාමරයක් පැවරීම. කේ. පී. බේබි නෝනා මහත්මිය**

කේ.පී.බේබි නෝනා මහත්මිය විසින් පවත්වාගෙන ගිය සතිපොළ කඩ කාමරයක් වෙනත් අයෙකුට පැවරීමට අවශ්‍ය බව පවසා සභාවට ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරමින් සභාවට අයවිය යුතු මුදල් අයකරගැනීමෙන් පසු මෙම කඩය වෙනත් අයෙකුට පවරාදීම සුදුසු බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:07 ළමා උයන විවෘත කරන ලෙස ඉල්ලීම - නාගරික ජනතාව**

බලන්ගොඩ නගරයේ ක්‍රීඩාංගනය අසල ඇති ළමා උයන විවෘත කරන මෙන් ඉල්ලා නගර වැසියෝ ගරු සභාව වෙත එවා තිබූ ලිපිය ඉදිරිපත් කළ ගරු සභාපතිතුමා මාර්තු මාසයේ දී මෙම ළමා උයන විවෘත කිරීමට යෝජනා කරන ලදී.

**මෙහි දී මේ සම්බන්ධව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

මේ පිළිබඳව නගර වැසියන් අවධානය යොමු කිරීම ගැන සතුටට පත්වන බවත්, මේ සඳහා නගර සභාවෙන් ආධාර මුදල් නොලැබුණ බවත්, ගම නැගුම වැඩසටහන යටතේ ලද ලක්ෂ 10න් එක් ලක්ෂ හැට දාහක මුදලක් වියදම් නොකර නැවත යවා ඇති බවත් ව්‍යාපෘතිය අවසන් බවට ලිපි යවා ඇති බවත් පැවසීය. මේ සඳහා කිසිවෙකුගේ ශ්‍රම දායකත්වයක් නොලද බව පැවසූ ගරු මන්ත්‍රීවරයා කොන්ත්‍රාත්කරු බැදි බැම්වල වතුර කවුළු නොතිබුණු බවත්, නගර වැසියන්ගෙන් විසි ලක්ෂයක මුදලක් ලැබුණේ යැයි පවසනවා නම් කොන්ත්‍රාත්කරු පැමිණ ඒ සඳහා වග උත්තර බඳින ලෙස තමා ඉල්ලා සිටින බව ද පැවසීය. ළමා උයන සඳහා ජනතාවගෙන් එකතු කළ මුදල් සියල්ල ළමා සංවර්ධන අරමුදල නමින් බැංකු ගිණුමකට බැර වූ බවත්, කිසිවෙකුගෙන් මුදල් හොරකම් කිරීමට කිසිදු අවශ්‍යතාවයක් නොමැති බවත්, කවුරුන් හෝ මුදලක් නැවත ඉල්ලා සිටියහොත් ලබා දීමට තරම් තත්ත්වයක් තමා සතු බවත් පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා ගරු සභාපතිතුමා ඇතුළු ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා මේ සඳහා සහයෝගය දැක්වීම යුතුකමක් වන බව ද පැවසීය. මෙම ස්ථානය කඩා දැමීමට තිබෙන ස්ථානයක් බවට ප්‍රකාශ කළ නිලධාරීන් පවා මුදල් ලබා දීමට මැලි උන බවත්, කොන්ත්‍රාත්කරුවන්ට සභාවට පැමිණීමට නොදී සභාපතිතුමා ඔවුනට බැන වැදුණු බවත් පැවසූ ගරු මන්ත්‍රීතුමා මනාප තරගය නිසා තමාගේ සෑම ව්‍යාපෘතියක්ම කඩා කප්පල් කර දැමූ බවත් කුමාරගම පාරට බෝක්කුවක් දමා එය නතර කිරීම හොඳම නිදසුනක් බවත් පැවසීය.

ළමා උයනේ ඉතිරි  වැඩ කටයුතු සඳහා නගර සභාවෙන් ලක්ෂ 05ක මුදලක් ලබා දෙන ලෙසත්, එවිට වැඩ අවසන් කර අප්‍රේල් මාසයේ ළමා උයන විවෘත කිරීමට සූදානම් කරන බවත් ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා පවසන ලදී.

**මේ සඳහා පිළිතුරු දුන් ගරු සභාපතිතුමා** ව්‍යාපෘතියට මුදල් ලැබෙන අයුරු පිළිබඳ අප සතුව අවබෝධයක් තිබිය යුතු බවත් 23%ශ්‍රම දායකත්වය ලබා ගත යුතු බව දැනගෙන සිටිය යුතු කරුණක් බවත් වැඩ කඩාකප්පල් කළා යැයි පැවසීම ඉල්ලා අස් කර ගන්නා ලෙසත් පැවසූ ගරු සභාපතිතුමා තමන්ට ද කොන්ත්‍රාත් භාර ගැනීමේ කිසිදු අවශ්‍යතාවයක් නොමැති අතර මෙතෙක් එසේ ලබා ගෙන නොමැති බවත් කොන්ත්‍රාත්කරුවන්ට බැන වදින්නේ වැඩ හරියාකාරව නිම නොකළ විට බව ද පැවසීය. ව්‍යාපෘති කාලය අනුව වැඩ නිමා කර නියමාකාරයෙන් බිල්පත් නොපිය වූ විට ඒ සඳහා මුදල් නොලැබෙන බවත් වැඩිදුරටත් පවසන ලදී. නාගරික සංවර්ධන අධිකාරිය විසින් ළමා උයන සෑදීම සැලසුම් කර තිබුණේ ක්‍රීඩාපිටිය තුල නොවුනත් ඒ සඳහා අවසර ලබා දුන් බව පැවසූ ගරු සභාපතිතුමා නගර සභාවේ යන්ත්‍ර සූත්‍ර භාවිත කර ළිං සකස් කර ජලය ලබා දී හැකි උපරිමය කළ බවත් පැවසීය. ඉන්පසු ලැබුණු ගම නැගුම පළාත් නැගුම ව්‍යාපෘති ඔස්සේ ලක්ෂ 30ක පමණ ප්‍රතිපාදන ගරු මන්ත්‍රීතුමාතුමා වෙත ලැබුණු නමුත් මේ වන විටත් ළමා උයන විවෘත කිරීමක් නොවුණු නිසා එම කටයුතු කඩිනමින් අවසන් කර මාර්තු මාසය වන විටවත් ළමා උයන විවෘත කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රී චමික වැවේගෙදර මැතිතුමා අදහස් දක්වමින්,**

මෙම ලිපිය මඟින් පෙනී යන්නේ සංවිධානාත්මකව සංවිධානය වී සහෝදර මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මන්ත්‍රීතුමා අපහසුතාවයට පත් කිරීමට ගෙන ආ යෝජනාවක් බවත්, ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා ප්‍රකාශ කළ පරිද්දෙන් අප්‍රේල් මාසයේ දී මෙය විවෘත කිරීමට සියලු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලබා දෙන බවටත්, යෝජනා කරන ලදී. 2015 අප්‍රේල් මාසය මුලදී විවෘත කිරීමේ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී අසංක විජය තිල්මිණී මැතිතුමා ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:08 බදු කුලී පදනම මත කඩ කාමරයක් ඉල්ලීම - කරුණාසිරි උඩවත්ත**

බදු කුලී පදනම මත කඩ කාමරයක් ඉල්ලා කරුණාසිරි උඩවත්ත මහතා විසින් කරන ලද ඉල්ලීම සභාවට ඉදිරිපත් කළ ගරු සභාපතිතුමා ඒ සම්බන්ධව ගරු සභාවේ අදහස් ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී.

මෙහිදී ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් පදික වේදිකාවේ අනෙකුත් කඩවලට කටයුතු කරන ලෙසම විශේෂ වරප්‍රසාද නොදී සාමාන්‍ය අයුරින් ක්‍රියා කරන ලෙසත් නැතහොත් ඒවා නීතියානුකූල කර ගැනීමට ක්‍රියා කිරීමට ඉඩ අවස්ථා ඇති බවත් විදුලිය සහ ජලය ලබා දීමේ අවශ්‍යතාවයක් නැතැයි ද පැවසූ යෝජනාවට ගරු නාගරික මන්ත්‍රී චමික වැවේගෙදර මැතිතුමා එකඟත්වය පළ කරන ලදී.

මෙහි දී මේ සම්බන්ධව සැලකිල්ලට ගත් ගරු සභාපතිතුමා දෛනික බදු මත මෙම කඩය ලබා දීමට යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී රූමි මැතිතුමා ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:09 ප්ලාස්ටික්/පොලිතින් ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය පිළිබඳ සාකච්ඡා කර ගැනීම**

ප්ලාස්ටික්/පොලිතින් ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය කරගෙන යාමේ දී තාක්ෂණික හා වෙළඳපොළ ගැටලු රාශියක් පැන නැඟුණු අතර, හිඟ මුදල් සම්බන්ධයෙන් ක්‍රියා මාර්ගයක් නොගෙන තවදුරටත් මෙය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සුදුසු සභා තීරණයක් ගැනීම පිණිස ඉදිරිපත් කර තිබූ ලිපිය සභාවට ඉදිරිපත් කළ ගරු සභාපතිතුමා ඒ සඳහා අදහස් විමසන ලදී. මේ පිළිබඳ අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ මේ සම්බන්ධ පුද්ගලයා අපෙන් ලොකු වගකීමක් ලබාගෙන ඇති බවත්, ඔහුට යම් යම් ගැටලු සහගත තත්ත්වයන් පවතින නිසා වෙළඳපොළ ගැටලු පවතින නිසාත් මෙම ව්‍යාපෘතිය කරගෙන යාමට වෙනත් පුද්ගලයෙකු ඉදිරිපත් වී නොමැති නිසාත් ඔහු සිදු කරන සේවාව සලකා ලබා මස් රාත්තලම නොඉල්ලා ඔහුට යම් සහනයක් ලබා දෙන ලෙසත් ය. එම ව්‍යාපෘතිය නිසා නගරයට හා පරිසරයට ලැබෙන ආරක්ෂාව පිළිබඳ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී එම්.ටී රූමි මැතිතුමා ඇතුළු සභාව දැක් වූ අදහස් සලකා බලා පරිසර හිතකාමීත්වය අරමුණු කරගෙන නීතිමය ක්‍රියාමාර්ගයකට නොගොස් විදුලි බිල ගෙවා අවසන් කරන ලෙසත්, ජූනි මාසය දක්වා අදාල සේවාව පවත්වාගෙන යන ලෙසත් සභාවට ලැබිය යුතු සියලු මුදල් ගෙවා අවසන් කරන ලෙසත් අදාල පුද්ගලයා හට දන්වා යැවීම සුදුසු බව ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්.ටී.එම්.රූම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:10 අවුරුදු උදානය 2015 විශේෂ විකාශනයට අවසර ඉල්ලීම - නිරංගා සවුන්ඩ්ස්**

2015 අප්‍රේල් 06 වන දින සිට 12 වන දින දක්වා සෑම දිනකම පෙ.ව 9.00 සිට ප.ව 6.30 දක්වා අවුරුදු උදාන විශේෂ විකාශය පැවැත්වීමට කටයුතු යොදා ඇති බැවින් ඒ සඳහා අනුමැතිය පතමින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාවට ඉදිරිපත් කළ ගරු සභාපතිතුමා 2014 වර්ෂයේ අය කරන ලද මුදල මෙම වර්ෂයේ දීත් අය කර මේ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:11 අඩු අදායම්ලාභීන් සඳහා වැසිකිළි හා නිවාස අධාර ලබා දීම**

2014 අයවැය මඟින් වෙන් කර ඇති මුදලට වඩා ලක්ෂ 24ක උසාවි දඩ මුදලක් ලැබී ඇති බැවින් එම මුදලින් ගරු සභාපතිතුමා ඉල්ලා සිටි නිවාස ආධාර 100ක් හා වැසිකිළි ආධාර

100ක් ලබා දීමට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින් එය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කළ ගරු සභාපතිතුමා එක් මන්ත්‍රීවරයෙකුගෙන් නම් 10 බැගින් ලැයිස්තුවක් සතියක් ඇතුලත ලබා දෙන ලෙස දන්වා සිටින ලදී.

**06:12 නිවාස ආධාර මුදලක් ලබා ගැනීම - ජිනරාජ විල්ලියා මහතා**

අංක 75/35, කිවුලවෙල, බළන්ගොඩ පදිංචි ජිනරාජ විල්ලියා මහතාගේ නිවස පහළින් සාදා ඇති බැම්ම පසුගිය වැසි දිනවල කැඩී ගොස් පහළින් ඇති ගෙවල් දෙකකට හානි වීමට ඉඩ ඇති නිසා එය පිළිසකර කර ගැනීම සඳහා ආධාරයක් ඉල්ලා සභාව වෙත එවා තිබූ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරමින් ඒ සඳහා මුදලින් රුපියල් 20,000ක ආධාර මුදලක් ලබා දීමට යෝජනා කරන ලදී.

ඒ පිළිබඳ අදහස් දැක් වූ ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා මෙම ක්‍රමයේ වැරැද්දක් ඇති බවත් තම ප්‍රදේශයේ ගැටලුවක් පිළිබඳ තමා දැනුවත් කළ යුතු බවත් තමාගේ නිර්දේශය නොමැතිව මුදල් ලබා දීම නුසුදුසු බව පවසන ලදී. ඒ අනුව ගරු උප සභාපතිතුමා සමඟ සාකච්ඡා කර ඔහුගේ නිර්දේශය මත මෙම ආධාර මුදල් ලබා දීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:13 නගර සභා ක්‍රීඩා පිටියේ තණකොළ කපා ගැනීම - පාපන්දු සංගමයේ ලේකම් ඩියුක් ඩැනියෙල් මහතා**

ඉහත කාරණය සම්බන්ධයෙන් කරන ලද ඉල්ලීම් ලිපිය සභාවට ඉදිරිපත් කළ ගරු සභාපතිතුමා දැයට කිරුළ සංවර්ධන වැඩසටහන නිසා ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමේ අරමුණින් තණකොළ කැපීම නවතා තිබූ බවත් ඒ පිළිබඳව තීරණයක් සභාව විසින් ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

මෙතෙක් ක්‍රීඩා පිට්ටනියේ තණකොළ කැපීම නවතා තිබීම වැරදි සහගත බවත් සංවර්ධන කාර්යයක් සඳහා තවමත් කිසිදු කොන්ත්‍රාත් සමාගමකට ක්‍රීඩාපිටිය භාර දී නොමැති නිසා තණකොළ කපා ක්‍රීඩා පිටිය ක්‍රමවත්ව පවත්වාගෙන යාම සභාවේ වගකීම බවත් ඒ සඳහා අවශ්‍ය කටයුතු කඩිනමින් ඉටු කරන ලෙසත් ගරු උප සභාපතිතුමා, ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී චමික වැවේගෙදර මැතිතුමා ඇතුළු සභාව විසින් අදහස් ප්‍රකාශ කිරීම සැලකිල්ලට ගත් ගරු සභාපතිතුමා තණකොළ කැපීම සඳහා සේවකයින් යොදවා ක්‍රීඩාපිටිය සකස් කිරීමට යෝජනා කරන ලදී.

මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:14 පොදු වෙළඳසැලේ අංක 16 දරණ මස් කඩය සඳහා තැන්පත් මුදල් ගෙවීම - එම්. රියාස් මහතා**

අංක 16 දරණ මස් කඩය සඳහා මාස 03ක මුදල් තැන්පත් කිරීම අවශ්‍ය නමුත් මාස 02ක මුදල තැන්පත් කර ඇති බැවින් ඉතිරි මාසයේ තැන්පත් මුදල් වාරික වශයෙන් ගෙවීමට අනුමැතිය පතමින් කර තිබූ ඉල්ලීම් ලිපිය සභාවට ඉදිරිපත් කළ ගරු සභාපතිතුමා මෙම මුදල වාරික වශයෙන් ගෙවීමට අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:15 මඟ නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන -2015- දින සියයේ ප්‍රමුඛතා සංවර්ධන වැඩසටහන**

ඉහත කාරණය සම්බන්ධයෙන් සෑම පළාත් පාලන මහජන නියෝජිතයෙක් සඳහා රුපියල් ලක්ෂ 10ක ප්‍රතිපාදන මුදලක් වෙන් කර එක් අයෙකුගෙන් එක් මාර්ග යෝජනාව බැගින් ලබා ගැනීමට තීරණය කර ඇති බව දන්වමින් සභාවේ දැන ගැනීම පිණිස ගරු සභාපතිතුමා විසින් මෙම ලිපිය මහ සභාවේ සභා ගත කරන ලදී.

**06:16 බාසිලෝනා නුවර සී.ආර්.පී.පී. වැඩසටහනේ 2015/2016 වැඩසටහන් සකස් කිරීම සහ අත්දැකීම් හුවමාරු කර ගැනීම.**

2015.02.24 හා 2015.02.25 යන දෙදින තුළ ස්පාඤ්ඤයේ,බාසිලෝනා නගරයේ යූ එන් හැබිටාට් ආයතනයේ දී පැවැත්වීමට නියමිත සී.ආර්.පී.පී වැඩසටහන සඳහා බළන්ගොඩ නගර සභාව වෙනුවෙන් සහභාගී වීමට බළන්ගොඩ නගර සභාවේ එක් සාමාජිකයෙක් සඳහා අනුග්‍රහය ලැබී ඇති හෙයින් ඒ සඳහා සුදුසු අයෙකු නම් කිරීමට උපදෙස් ලබාදෙන ලෙස ඉල්ලමින් සභාව වෙත යොමු කරන ලද ලිපිය සභාවට ඉදිරිපත් කල ගරු සභාපතිතුමා විසින්, ඒ සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිමල් ප්‍රේමතිලක මහතා සුදුසු බවත්, එම වැඩසටහනට සහභාගී වීම වෙනුවෙන් වන සියලු වියදම් වැඩමුළුව සංවිධානය කරනු ලබන ආයතනයෙන් දරන බවත් මහා සභාවට දන්වන ලද අතර, ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

මෙහි දී මේ සඳහා ආරාධනා ලැබී ඇත්තේ කාට දැයි උප සභාපතිතුමා ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දුන් සෞඛ්‍ය පරීක්ෂකතුමා මෙම ලිපිය යොමු කර ඇත්තේ ගරු සභාපතිතුමාට බවත් එතුමා සහභාගී නොවන බව පවසන හෙයින් සභාවේ සාකච්ඡා කොට තීරණයක් ගෙන සුදුසු අයෙක් නම් කිරීමෙන් පසු එම ආයතනය වෙත දන්වා යවා අවශ්‍ය කටයුතු සූදානම් කළ හැකි බවත් පැවසීය.

අනතුරුව සභාවේ සාකච්ඡා කොට මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා සහභාගී කිරීමට සභාපතිතුමා කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් දන්වන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:17 මඟ නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන - 2015 අවිච්ඡේද ව්‍යාපෘති**

මඟ නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහනේ 2014 වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කරන ලද මාර්ග සංවර්ධන ව්‍යාපෘතින්ගෙන් 2014.12.31 දිනට ගිවිසුම් අත්සන් කර, වැඩ ආරම්භ නොකරන ලද සියලු ව්‍යාපෘති අවලංගු කරන ලද බව දන්වා මහා මාර්ග හා අයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් එවන ලද ලිපිය සභාවේ දැන ගැනීම පිණිස ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**06:18 පී. ආර් 4006 කැබ් රථයට අලාභ හානි කිරීම සම්බන්ධව පොලිස් කොමිසම වෙත ඉදිරිපත් කිරීම සඳහා තොරතුරු ඉල්ලීම - නීතිඥ චන්ද්‍රසේකර මහතා**

ඉහත කරුණ සම්බන්ධයෙන් නීතිඥ චන්ද්‍රසේකර මහතා එවා තිබූ ලිපිය සභාව වෙත ඉදිරිපත් කළ ගරු සභාපතිතුමා මේ පිළිබඳ සාධාරණ පරීක්ෂණයක් පවත්වා වැරදිකරුවන් අත් අඩංගුවට ගැනීමට අවශ්‍ය ලිපි ලේඛන නීතීඥ මහතා වෙත ලබාදීමට යෝජනා කරන ලදී.

මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:19 පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ වාර්ෂික සාමාජික මුදල ගෙවීම

පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ වාර්ෂික සාමාජික මුදල වන රු. 10000.00 ක මුදල ගෙවීමට අනුමැතිය පතමින් කර තිබූ ඉල්ලීම සභාව ඉදිරිපත් කළ ගරු සභාපතිතුමා එම මුදල ගෙවීම සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී

මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:20 නිවස ඉදිරියේ මාර්ගය නාය යෑම - එම්. එම්. නන්දිපාල ජයතිස්ස මහතා

අංක 980/ඒ, මෙගොඩ කිරිදිගල, බලන්ගොඩ පදිංචි නන්දිපාල ජයතිස්ස මහතාගේ නිවස ඉදිරියෙන් වැටී ඇති කිරිදිගල සිය ඕලුගංතොට මාර්ගය තද වැසි හේතුවෙන් කඩා වැටී වැසි දිනයන් හිදී නිවසට වතුර ගලන බවත්, කාණුව අවහිර වී වාහන ගමන් කිරීමට අපහසු තත්ත්වයක් උදා වී ඇති නිසා එය නිසි පිළිවෙළකට සාදා දෙන ලෙස ඉල්ලා සභාවට එවා තිබූ ලිපිය ඉදිරිපත් කරමින් ගරු සභාපතිතුමා විසින් ඒ පිළිබඳ පරීක්ෂා කර බලා අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බව යෝජනා කරන ලදී

මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී අසංක විජය නිල්මිණි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

## 07. රු. 10,000.00 ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

රු. 10,000.00 ට වැඩි ගෙවීම් සියල්ල මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ අනුමැතිය ලබාදීමට යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම.

### 08:01 බුද්ධ ජයන්ති මාර්ගයේ ගල් අතුරා තාර දමා සංවර්ධනය කිරීම.

බුද්ධ ජයන්ති මාර්ගයේ ගල් අතුරා තාර දමා සංවර්ධනය කිරීම සඳහා අමුණා ඇති ප්‍රමාණ මිල සහ මිණුම් අනුව වැඩ වියදම් රුපියල් 910,805.10 ලෙස දක්වා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරමින් එය අනුමත කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගරසභා ගරු මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 08:01 කියවීම් මාසයේ වැඩසටහන්වල ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා වියදම සඳහා ඇස්තමේන්තුව අනුමත කර ගැනීම.

2014 ඔක්තෝම්බර් ජාතික කියවීම් මාසය වෙනුවෙන් පවත්වන ලද කථික, රචනා හා චිත්‍ර තරගයේ තෑගි හා සහතිකපත් මුද්‍රණය සහ උත්සවයේ අනෙකුත් වියදම් රුපියල් 98,000

ලෙස දක්වා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරමින් එය අනුමත කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය. රන ලදී.

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

### 09:01 තානායම් ගොඩනැගිල්ලේ දුර්වර්ණ ස්ථානවල තීන්ත ආලේප කරගැනීම සඳහා වැඩකුළිය.

බලංගොඩ තානායම් ගොඩනැගිල්ලේ දුර්වර්ණ වූ ස්ථානවල තීන්ත ආලේප කර ගැනීමට වැඩ කුළිය සම්බන්ධ මිල ගණන් මහ සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කල ගරු සභාපතිතුමා ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමන්, ගරු නාගරික මන්ත්‍රි ධර්මසේන සමරසිංහ මැතිතුමන්, ගරු නාගරික මන්ත්‍රි චමික වැවේගෙදර මැතිතුමන්, ගරු නාගරික මන්ත්‍රි එම්. ජේ. මලීක්ෂා මැතිතුමන් හා ගරු නාගරික මන්ත්‍රි අසංක විජය නිල්මිණි මැතිතුමන් විසින් එම යෝජනාවට විරුද්ධව අදහස් ප්‍රකාශ කල අතර ගෙවීම් අනුමත නොකරන බවට ප්‍රකාශ කරන ලදී.

### 09:02 අංක 46-3164 දරණ ටේලරය සම්පූර්ණයෙන් අළුත්වැඩියා කරගැනීම.

බලංගොඩ නගර සභාව සතු 46-3164 දරන ට්‍රේලරය සම්පූර්ණයෙන් අළුත්වැඩියා කර ගැනීම සඳහා අවම මිල ගණන් කැඳවා ඇති බවත්, එහි දී අවම මිල ගණන් ලෙස තෙබුවන ගරාජය මඟින් රුපියල් එක් ලක්ෂ විසිනව දහස් එකසිය පනහක මුදලකට යටත්ව මෙම කාර්යය කිරීමට එකඟ වී ඇති බවත් පැවසූ ගරු සභාපතිතුමා ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්. ටී. එම්. රුම් මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය

### 09:03 මාර්ග තලනය අළුත්වැඩියා කර ගැනිම.

බලංගොඩ නගර සභාව සතු මාර්ග තලනය සම්පූර්ණයෙන් අළුත්වැඩියා කර ගැනීම සඳහා එය මිලට ගත් සොනෙක් ආයතනය මඟින් රුපියල් පනස් පන් දහස් තුන්සියයි ශත විස්සක මුදලකට යටත්ව මෙම කාර්යය කිරීමට එකඟ වී ඇති බවත් පැවසූ ගරු සභාපතිතුමා ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්.ටී.එම්.රුම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**09:04 PF 4006 කැබ් රථයට ටයර් 04 ක් මිලදී ගැනීම.**

බලංගොඩ නගර සභාව සතු PF 4006 කැබ් රථයට ටයර් 04 ක් මිලදී ගැනීම සඳහා අවම මිල ගණන් කැඳවා ඇති බවත්, එහි දී අවම මිල ගණන් ලෙස u & h wheel service ආයතනය මඟින් ටයර් ලබාගැනීම සඳහා ටයර් 01ක් රුපියල් විසිතුන්දහස් නවසියක මුදලකට යටත්ව මෙම කාර්යය කිරීමට එකඟ වී ඇති බවත් පැවසූ ගරු සභාපතිතුමා ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**09:05 HF 8952 අංක දරන ට්‍රැක්ටරය අමතර කොටස් යොදා අළුත්වැඩියා කිරීම.**

බලංගොඩ නගර සභාව සතු HF 8952 අංක දරන ට්‍රැක්ටරය අමතර කොටස් යොදා අළුත්වැඩියා කිරීම සඳහා අවම මිල ගණන් කැඳවා ඇති බවත්, එහි දී අවම මිල ගණන් ලෙස තෙබුවන ගරාජය මඟින් රුපියල් අනූතුන් දහස් අනූහතක මුදලකට යටත්ව මෙම කාර්යය කිරීමට එකඟ වී ඇති බවත් පැවසූ ගරු සභාපතිතුමා ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

**මෙදින සභාව සඳහා යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් නොවිනි.**

## 11. යෝජනා

**11:01 නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා.**

11:01:01 මහජන පොළ සංශෝධිත අතුරු ව්‍යවස්ථාව ගරු සභාවට ඉදිරිපත් කරන ලෙස ඉල්ලීම

1956 සිට පවතින අතුරු ව්‍යවස්ථාවක් ලෙස මෙය පවත්නි බවත් කාලීන අවශ්‍යතා මත සංශෝධන ඉදිරිපත් කිරීම අවශ්‍ය යැයි හැගුණ නිසා සංශෝධනය කිරීමට තීරණය කල බවත් පැවසූ ගරු සභාපතිතුමන් විසින් ඉහත යෝජනා මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබාදීමට යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා.**

මේ වන විට පවතින නගර සභා නීතිය අනුව පොදු වෙළඳසැලේ හැර වෙනත් ස්ථාන වල මාලු හා එළවලු විකිණීමට ඇති හැකියාව විමසීමට අවශ්‍ය විය.

ඒ අනුව ආදායම් පරීක්ෂක මහතාගේ සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාගේ අදහස් විමසීම සඳහා මහා සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කරන ලදි.

එහිදී දැනට තිබෙන නීති රීති අනුව එසේ කළ නොහැකි බව ආදායම් පරීක්ෂක මහතා සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් දන්වන ලදි.

නමුත් බළන්ගොඩ නගරයේ ඇති ඉරිදා පොළෙහි නීතිවිරෝධි ආකාරයට සෑදූ කඩකාමර වල මාලු, එළවලු හා පළතුරු වෙළඳාම් කරන බවත්, එසේ වෙළඳාම් කළ නොහාකි බව නිලධාරීන් පවසන බවත්, නීත්‍යානුකුල නොවන ලෙස ඉරිදා පොළෙහි කටයුතු සිදු වන බවත් නගර සභා ගරු මන්ත්‍රි චමික ජයමිණ වැවේගෙදර මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි. අවස්ථා කීපයකදීම අතුරු ව්‍යවස්ථාව මග හැරිය නමුත් සිදු වූ ප්‍රමාද දෝෂ නොසලකා ඒ පිළිබඳ කටයුතු කළයුතු බව ආදායම් පරීක්ෂක මහතාට දන්වන ලදි. එසේම බදු ගෙවන ජනතාවට හා සති පොලේ වෙළඳාම් කරන අයට ලෙස නීතිය වර්ග නොවිය යුතු බවද, සියලු දෙනාටම නීතිය සමාන විය යුතු බවද, යම් යම් පුද්ගලයන් තම නිවෙස් ඉදිරිපිට වෙළඳසැල් ආරම්භ කිරීමට විමසන බවද, ඒ සඳහා අවසර ලබා නොදෙන බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුවන් විසින් නීති විරෝදී ආකාරයට බළන්ගොඩ නගර සභාවේ අනුදැනුම මත වෙළඳාම් සිදු කරන බවද සම්පූර්ණයෙන්ම නීති විරෝධී වෙළඳාමක් සති පොළ තුළ සිදුවන බව ප්‍රකාශ කරන ලදි. එලෙස එළවලු, පලතුරු හා මාලු වෙළදාම නීතිවිරෝධී ආකාරයට සිදුවන දේ තහනම් කර ඔවුන් පොදු වෙළඳපොලට යොමුකරන ලෙසද, එතුලින් වැඩි ආදායමක් ලැබිය හැකි බවද නීත්‍යානුකුල ලෙස වෙළඳාම් කිරීමට ජනතාව යොමු කිරීම තුළින් නගර සභාවේ විනිවිද භාවය තහවුරු කරන ලෙස ඉල්ලා සිටින ලදි.

**ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

වත්මන් ජනපතිතුමන් පත්වීමට ප්‍රථමව මාස ගණනකට කලින් ධීවර සංස්ථාව පිළිබඳ යෝජනාවක් ගෙනා බවත්, එවිට ආදායම් පරීක්ෂක මහතාට අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට පැවරූ අතර එවෙලෙහි ගැටලුව මතුවූ බවත්, මේ වන විට නැවත එම යෝජනාව මන්ත්‍රීවරුන්ට ගෙන ඒමට සිදුව ඇති බවත්, මෙහිදී සිදුකල යුතු නිවැරදි පිළිවෙල පොළෙහි වෙලදාම් කරන අයගේ නම් ලයිස්තු ගත කළ යුතුබවත්, ඒවා පිළිවෙලකට සකසා ඒ අනුව කඩකාමර බෙදාදිය යුතු බවත්, නමුත් කඩා පනින හමුදාවක් ලෙස වෙළඳපොලට පැන කඩ කාමර අයිති කරගත් බවත්, පසුව සමහර පිරිසක් කඩ කාමර විකුණාදමා ඇති බවත්, මෙහි සාධාරණයක් නොමැති බවත්, මෙතුලින් කිසිවෙකුටත් පහර ගැසීමක් නොකරන බවත් දන්වා සිටින ලදි.

එසේම එදා වේල සොයාගෙන ජීවත් වන වෙළඳුන් මේ නිසා අසරණ වී ඇති බවද, අනුගමනය කළ ක්‍රමයේ ඇති දුර්වලතා නිසා 2011 සිට ගත වූ කාලය තුළ ඉරිදා පොලේ එළවලු හා මාලු කඩවලින් යම් කුලියක් නගර සභාවට අයකර ගත්තේ නම් ඒවා පරිත්‍යාග හෝ කප්පම් විය යුතු බවද, එය සම්පූර්ණයෙන් නීති විරෝධී වන බවද, ධීවර සංස්ථාවේ ශාඛාව බළන්ගොඩ පිහිටවීම සඳහා ගෙනා යෝජනාවට ඉඩක් ලබාදුන්නේ නම් වටිනා බවද, මෙම ක්‍රමය සම්පූර්ණයෙන්ම වැරදි බවද උපසභාපතිතුමන් විසින් පෙන්වා දෙන ලදි. නිවැරදි ක්‍රමවේදයක් මත මේ දේවල් සිදුකරන ලෙසද,ඒ සඳහා සහයෝගය ලබාදෙන බවද නමුත් බලපෑම් මත අනුමත කිරීම සඳහා ඉදිරිපත් කළහොත් අතුරු ව්‍යවස්ථාව බහුතර මන්ත්‍රීවරුන්ගෙන් එය පරාජය කරන බවත්, නිලධාරීන් නිවැරදි මාර්ගය පෙන්වා දිය යුතු බවත්, දැනට ඉදිරිපත් කර ඇති අතුරු ව්‍යවස්ථාවට විරුද්ධ වන බවත්, එය නිවැරදි කරන ලෙස දැන්වූ අතර එසේ නොවුණ හොත් නිලධාරීන් මෙන්ම දේශපාලන අධිකාරිය ද අසරණ වන බවත්, මෙම කරුණු දූෂණ හා වංචා ලෙස ප්‍රශ්නකාරී ගැටලු රාශියකට මුල්වන බවත්, මන්ත්‍රීවරුන් නීති සෑදීමට නොදන්නා අතර නිලධාරී මතයට ගරු කළ යුතු බවත්, පැවසූ ගරු උපසභාපතිතුමන් විසින්

ඉදිරියට ගමන් කිරීමේදී නිවැරදි ගමනක් යාමට ආරාධනා කරන ලදි. එසේම සිදුවන වැරදි පෙන්වා දෙන ලෙසද දන්වන ලදි.

**ගරු සභාපතිතුමා**

තමන් ද පොදු වෙළඳසැලේ සිටි බවත්, කාලයෙන් කාලයට පොළ තිබෙන තැන වෙනස් වූ බවද, අතුරු ව්‍යවස්ථා පිළිබඳ නොබලා මහජන පොළ අලුතින් විවෘත කළ බවත් ඒ අවස්ථාවේදී සිටි පරණ වෙළඳුන් මෙන්ව නව වෙළඳුන්ද ඊට ඇතුළත් වූ බවත්, එතුළින් කිසිවෙකුටත් අසාධාරණයක් සිදු නොවුණ බවත් පෙන්වා දෙන ලදි. key money ලබාගෙන කඩ කාමර 06 ක් කුලී පදනම මත අනෙක් කඩ කාමරද ලබාදුන් බවත්, එම අවස්ථාවේ දී අතුරු ව්‍යවස්ථා නොබැලූ බවත්, 2005 වසරේදී මහජන පොළ සකසා විවෘත කළ බවත්, ඒ වන විටද සෑම මහජන පොළකම මාලු, මස්, බිත්තර විකුණන ලද බවත්, ව්‍යවස්ථාව වෙනස් කිරීමට යෝජනා කරන ලද්දේ එහි මාලු විකිණීම තහනම් බවට සඳහන් ව ඇති බැවින් බවද, කාලීන අවශ්‍යතා මත මෙම සංශෝධන සිදුකිරීමට වී ඇති බවද, එසේම දන්නා පරිදි සෑම පොළකම මෙම ගැටලුව පවතින බවද, මෙහි නීත්‍යානුකූල ගැටලුවක් පවතින නමුත් සෑම දෙසම පවත්වාගෙන ගිය මාලු ලොරි එක තැනකට ගෙන ඒවා ක්‍රමවත් කළ බවද, නමුත් නීති සංශෝධනය නොකළ අතර ධීවර සංස්ථාවට වෙළඳාම් සඳහා ඉඩ නොදුන්නේ මහජන පොළෙහි අතුරු ව්‍යවස්ථාව අනුව නගර සභාවෙන් අවසර ලබානොගැනීම සහ බළන්ගොඩ මාලු වෙලඳුන්ට අසාධාරණයක් වන බැවින් බවද, එසේම මහා පරිමාන එළවලු කඩ 02කට නඩු පවරා ඇති බවද උසාවි තීරණ අනුව ක්‍රියාකිරීමට සිදුවන බවද ගරු සභාපතිතුමන් විසින් පෙන්වා දෙන ලදි.

මහජන පොළ තුළ මස්, මාලු විකිණිය නොහැකි බවත් එසේම සහයෝගය ලබාදෙන්නේ නම් අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට හැකියාව පවතින් බවත්, ඉරිදා පොළ සැදුවත් නීතිය වෙනස් කිරීමට නොහැකිවීම නිසා ගැටලු මතුව ඇති බවත්, ඉදිරියට එන කුමන පාලනයකින් වුවද අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කර ගැනීමට හැකිනම් එය යහපත් දෙයක් බවද, සිදුවූ වරද පිළිගන්නා බවද සතියේ දිනයන් වල එළවලු විකුණන පිරිස 20 කට වැඩි පිරිසක් සිටින බවද, ඒ පිරිස සඳහා විකල්පයක් ලබාදිය යුතු බවත්, කලින් සිටි සභාපතිවරුන් ඇතුලුව තමනුත් විකල්පයට ඉඩදුන් නමුත් නීති සෑදීම නොකළ අතර යෝජනා කර සභාවෙන් තීරණයක් ගත යුතු බවත්, අතුරු ව්‍යස්ථාව අනුව ක්‍රියාකිරීමේදී විරුද්ධවාදීන් නීතිය හමුවට ගියහොත් එවිට ලැබෙන නීත්‍යානුකූල තීරණය අනුව කටයුතු කළ හැකි බවත්, එබැවින් තමන් ඇතුලු හිටපු සභාපතිවරුන්ගෙන් සිදුවූ අතපසුවීම නිවැරදි කර ඉදිරියේදී කිසිවෙකුටත් වරදක් නොවන ආකාරයට සංශෝධන සිදුකිරීමට කටයුතු කිරීමට සහයෝගය ලබාදෙන ලෙස ගරු සභාපතිතුමන් විසින් ඉල්ලා සිටින ලදි.

**ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

හිටපු ගරු සභාපතිවරුන් අතින් මෙම වැරදි සිදු නොවූ බවත්, ඔවුන්ගේ කාලයේ පොදු වෙළඳසැලේ සිට පදික වේදිකාවන් වලද වෙළඳාම් සිදුවූ බවත්, වරද සිදුකළේ මෙම සභාවෙන් බවත්, මේ නිසා නොයෙකුත් ගැටුම් සිත් රිදවීම් ඇති වු බවත්, මෙම සිදුවීම් වලට දී ඇති වැරදි අර්ථකථන නිසා ගැටලු මතුව ඇති බවත් දැන්වූ ගරු සභාපතිතුමන් විසින් අයවැය සඳහා ඡන්දයා ලබාදුන් පමණින් ගරු සභාපතිතුමාගේ වැරදි නිවැරදි සියලුම දේ සඳහා සහයෝගය ලබා නොදෙන බවත් අදාළ වෙළඳුන් කැඳවා ඔවුන් හා සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදි.

**ගරු සභාපතිතුමා**

ගරු උපසභාපතිතුමාගේ ඉල්ලීම අනුව මහජන පොළ වෙළඳුන් සමග සාකච්ඡා කර තීරණයක් ගැනීම සඳහා 2015 පෙබරවාරි 02 දින පෙ.ව. 10 ට රැස්වීමක් කැඳවන ලෙස ගරු ලේකම්තුමියට උපදෙස් ලබාදෙන ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා.**

හිටපු සභාපතිවරුන් ඉහත කාරණය සම්බන්ධයෙන් වගකිය යුතු නොවන බවට තමන් සිතන බවත්, ඔවුන් කිසිවෙක් මෙම වෙළදාම් සඳහා සම්බන්ද නොවූ බවත්, ගරු සභාපතිතුමාගේ වාසනාව මත කිහිපවරක් සභාපති ලෙස තේරිපත් වූ බවත්, නමුත් එතුමාගේ පරපුර හා ගෝලයන් පිරිසට ආදායම් මාර්ගයක් සකස් කර දීම සිදුකර ඇති බවත්, එවන් අවස්ථාවල නීතීකටයුතු නොපෙනී යාමට ඉඩ ඇති බවත් දැන්වූ නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් ගරු සභාපතිතුමන් තමාගේ වරද නිහතමානීව පිළිගත් බවත්, එතුමන් සිදුකරන සත් ක්‍රියා සඳහා සහයෝගය ලබාදෙන බවත් ප්‍රකාශ කරන ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා.**

1946 සැකසූ අතුරු ව්‍යවස්ථාව මෙතෙක් පැවති බවත්, හිටපු සභාපතිවරුන් යටතේද එය ක්‍රියාත්මක වූ බවත්, නමුත් එය ක්‍රියාත්මක මට්ටමේ නොතිබූ බවත්, ඉරිදා උදෑසන 6 සිට සවස 6 දක්වා පමණක් ඉරිදා පොල පැවැත්විය යුතු තත්ත්වයකදි මෙය ක්‍රියාත්මක නොකිරීම පවතින සභාවේ වගකීම පැහැර හැරීමක් බවද එයට මෙම සභාව වගකීව යුතු බවද දන්වන ලදි. පොදු වෙළඳපොලෙහි පිරිසත් බදු ගෙවාගෙන සිටින එක් පිරිසකට පමණක් ආර්ථික වාසි ලබාගෙන පැවැත්වීම නුසුදුසු වන අතර, එක් ජන කොටසක් පිළිබඳ අවධාණය යොමු කළ බැවින් හිටපු ජනාධිපතිපති තුමාට ධූරය අහිමි වු බවද, එම ක්‍රියාමාර්ගය අප අනුගමනය නොකළ යුතු බවත්, විශමතා අවම කර ගැනීමට ක්‍රියාකල යුතු බවත්, මෙම ගැටලු සහගත තත්ත්වය අවම කර ගැනීම සඳහා මහජන පොළ අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කර ගැනීම අවශ්‍ය බව ද නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපතිතුමා**

නගරයේ වෙළඳුන් වැඩිවීම නිසා මෙම ගැටලුව ඇති වූ බවත් පොදු වෙළඳසැල තුළ වෙළදාම් කළ හැක්කේ වෙළඳුන් 05 දෙනෙකුට පමණක් බවත් අනෙක් වෙළඳුන් දෙස සානුකම්පිතව බැලීම නිසා ගැටලුව මතු වූ බවත්, මෙම ගැටලු පෙබරවාරි මස 02 දින රැස්වීමේදී විසඳගැනීමට සාකච්ඡා කරන බවත් ඒ අනුව අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට කටයුතු යොදන බවත් දන්වන ලදි.

**11:01:02 නගර සභා තානායම ටෙන්ඩර් කිරීමට යෝජනා කිරීම**

ගරු සභාපතිතුමන් විසින් ඉහත යෝජනා මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබාදීමට යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

එහිදී පහත සඳහන් අදහස් පළ කරන ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා.**

ප්‍රථමයෙන් බුද්ධිමත්ව ඡන්දය භාවිතා කරන ලද ලක්ෂ 62 ක ජනතාවට හා ඒ සඳහා පුරෝගාමී වූ සියළුම දෙනාට ස්තුතිය පළ කරන බව දැන්වූ ගරු

මන්ත්‍රීතුමන් විසින් තානායම ටෙන්ඩර් කළ යුතු යැයි යෝජනා කළ සෑම අවස්ථාවකම රාජ්‍ය උත්ණය වැඳුණු මැති ඇමතිවරු ආහාර ගැනීමට හා වෙනත් ශරීර කෘත්‍යයන් සඳහා තානායමට පැමිණෙන බවත්, පසුගිය සභාවාරයේ දී රජකුමාරයෙක් ශරීර කෘත්‍යයක් සඳහා තානායමට ආ බවත්, නමුත් බළන්ගොඩ ජනතාවගේ වාසනාවට නැවත එලෙස කුමාරවරු බළන්ගොඩ තානායමට නොපැමිණෙන බවත් එසේම ලැබීඇති තොරතුරු වලට අනුව දැයට කිරුළ තුළින් ලක්‍ෂ ගණනක පාඩු සිදුවී ඇති බවත් පවසන ලදි.

එසේම පෙර සිටි කළමනාකරු විශාල පාඩුවක් සිදු කර පළාගිය බවද, පසුගිය දෙසැම්බර් මස රු. ලක්‍ෂ 6 කට අධික අලාභයක් බළන්ගොඩ තානායමේ සිදුව ඇති බවද, එසේම කළමනාකාර වරුන් පත් කිරීමේ ක්‍රමවේදයේ විනිවිද භාවයක් නොමැති බවත්,ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් ඔවුන් සපුරා තිබේද, ඔවුන් නමින් ලිපිගොනුවක් තිබේදැයි නොදන්නා බවත්, එසේම කිසිවෙකුට පුද්ගලික පහරගැසීමක් සිදු කිරීම තම අභිමතය නොව වගකීම යුතුකම ක්‍රියාත්මක කිරීම සිදුකරන බවත්, ජනතාවගේ බදු මුදලින් නඩත්තු වන තානායම නිසා ගැටළු මතුවන බවත්, නිලධාරීන් එය දැඩිව තේරුම්ගත යුතු බවත්, තමාගේ රැකියාව මෙන්ම විශ්‍රාම වැටුප රැකගත යුතු බවත් වංචා දූෂණ අනුමත කිරීම තුළ රැකියාව අහිමි විය හැකි බවත් නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමන් විසින් පෙන්වා දෙන ලදි. එසේම බළන්ගොඩ ජනතාවගේ මුදල් අයතා ලෙස පරිහරණය නොකර තානායම ටෙන්ඩර් කිරීම සුදුසු බවද, එහි නිලධාරීන් නොවන බොහෝ පිරිස පදිංචිව සිටින්නන් කිසිදු ආතක් පාතක් නොමැති පිරිසක් බවද, දෛනික ගණුදෙනු කරුවන් පැමිණියත් නැතත් ආහාර පිසීම සිදු කිරීමට අධික පිරිවැයක් දැරීමට සිදුවන බවද, මේ නිසා බදු ගෙවන ජනතාව කණගාටුවට පත්ව ඇති බවද, ලංකාවේ තානායම යන නාමයේ ගෞරවනීයත්වය බළන්ගොඩ තානායමේ නොමැති බවද, මේ කරුණු නිසා වැදගත් අයෙකුට එයට යා නොහැකි බවද, බලාපොරොත්තු වූ සාධාරණ සමාජය ගොඩනැගෙමින් තිබෙන අවධියක නිවැරදි දේ නිවැරදි ලෙසද, වැරදි දේ වැරදි ලෙසද බලන මෙන් ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටි ගරු මන්ත්‍රීතුමන් විසින් තානායම ටෙන්ඩර් කර නගර සභාවට ආදායමක් ලබාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලා සිටින ලදි.

**නගර සභා ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා.**

තානායම විවෘත කර වසර ගතවූ වසර 04-05 ක කාලය තුළ එය ආරම්භ කළ මුල් දිනයේ සිට ටෙන්ඩර් කිරීමට තමන් යෝජනා කළ බවත්, එය නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමාගේ හෝ ගරු ජනාධිපතිතුමාගේ බලපෑමක් හෝ කියුම් බහක් නිසා හෝ නොවන බවද, මෙතෙක් කළක් ගරු සභාපතිතුමාගේ අදහස් අනුව මෙම යෝජනාව කල්දැමූ බවද, නමුත් එම කල්දැමීම තුළ යහපත් ප්‍රතිඵලයක් අත්නොවූ බවද, මේ වන විට ලංකාවේ ප්‍රධාන මාතෘකාව වී ඇත්තේ යහපාලනයක් ඇතිකළ යුතු සේම පවුල් පාලනය පිටු දැකීම බවද, එසේම තමන් පිළිගනු ලබන්නේ නගර සභාවේ ගණකාධිකාරවරයා පවසන තොරතුරු බවද, දෙසැම්බර් මස තානායමේ අලාභය රු. ලක්‍ෂ 06 ඉක්ම වන බව වගකීමෙන් පෙන්වා දෙන බවද, නමුත් එහි සේවය කරන නිලධාරීන්ගේ වැටුප හා සේවා ගාස්තු අධිකව ගෙවන නමුත් ලාභයක් නොපෙන්වන බවද, එබැවින් කණගාටුවෙන් වුවද තානායම ටෙන්ඩර් කර අවසන් වූ පසු එයට වීරසිංහ කම්පැනි සහ පෞද්ගලික සමාගම යනුවෙන් නම වෙනස් කිරීම ගැටළුවක් නොවන බව ද ප්‍රකාශ කරන ලදි.

එබැවින් පැහැදිලිවම ප්‍රකාශ කරන කාරණය නම් මින් ඉදිරියට තානායමේ ගෙවීම් අනුමත නොකරන බවත්, මේ ආකාරයට ඉදිරියට පවත්වාගෙන යාමෙන් තිබෙන ආදායමක් නොලැබී යන බවත්, නිලධාරීන්ට විගණනයට යොමුවීමට සිදුවීමෙන් අපහසුතාවයට පත්වීය හැකි බවත්, තානායමේ තත්ත්වය සෝචනීය බවත් අනාථයන්ගේ ලැගුම් ස්ථානයක් බවට එය පත්ව ඇති බවත්, තානායම් කාර්ය

මණ්ඩලයේ හැසිරීම් නිසා උත්සව අවස්ථා රාශියක් අහිමිව ඇති බවත්, පෙන්වා දුන් ගරු උපසභාපති තුමා නිලධාරීන්ට තානායමේ කළමනාකාරීත්වයත් සමග රාජකාරී කළ නොහැකි තත්ත්වයකට පත්ව ඇති බව පෙන්වා දෙන ලදි. සෞඛ්‍ය, කර්මාන්ත වැටුප් හා මන්ත්‍රී දීමනා ගෙවීමේදී කිසි විටෙකත් විරුද්ධ නොවන නමුත් තානායමේ කිසිදු ගෙවීමක් අනුමත නොකරන බවද, තානායම ටෙන්ඩර් කිරීම අවශ්‍යම බවත් පෙර වසර 20 වැනි කාලයකට තානායම පැවරූ නමුත් වසරක කාලයක් තෝරා ගැනීම සුදුසු බවත් අවසාන වශයෙන් එතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික්ෂා මැතිතුමා**

තානායම සම්බන්ධව දිගින් දිගමට ප්‍රශ්න ගැටළු මතුවන බවත්, මෙය විශාල සම්පතක් බව පිළිගන්නා බවත්, නමුත් මෙයින් නගර සභාවට ලාභයක් වී නොමැති බැවින් පාඩු ලබන තත්ත්වයක් තුළ ටෙන්ඩර් කිරීම සුදුසු බවත්, නොවැම්බර් මසද මේ සම්බන්ධව සාකච්ඡා කළ බවත්, ඒ අවස්ථාවේ ද මෙය ටෙන්ඩර් කළ යුතු බවට තීරණය කර ගත් බවත්, එය ක්‍රියාත්මක නොවූ බවත් ප්‍රකාශ කරන ලදි. තානායම පිළිබඳ දිගින් දිගටම ජනතාව ප්‍රශ්න කරන බවද, තරගකාරීව ඊට මුහුණ දිය නොහැකි බවද, නම හානිකර නොගෙන නගර සභාවට ආදායමක් උපයාගැනීම සඳහා තානායම ටෙන්ඩර් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

තානායම ආභරණයක් වන නමුත් සෑම දිනකම එය විවේචනය කරමින් සිටීම සුදුසු නොවන බවද, මෙයින් විශාල ආදායමක් උත්පාදනය කළ හැකි බවද, චමික වැවේගෙදර මැතිතුමා ගෙනා යෝජනාව ස්ථිර කරන බවද, නමුත් මෙය ටෙන්ඩර් කර ලැබෙන මාසික ආදායම කිසිවෙකුටත් ගැටළුවක් හිස රදයක් නොවන බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා ගරු සභාපතිතුමාගේ පුතා තානායමේ කළමනාකරු වීම සම්බන්ධයෙන් ආඩම්බර වන බවද පවසන ලදි. නමුත් ආයතනයක් කළමනාකරනය කිරීම ඉතා අපහසු දෙයක් බවද, ඒ සඳහා නිසි දැනුමක් අවබෝධයක් තිබීය යුතු බවද, එය නොමැති වුවහොත් ආයතන පාඩු ලබන බවද, තානායමට පාඩු සිදුවී ඇත්තේ මෙම කරුණු නිසා බවද, තානායම් යනු නිදහස් ස්ථානයක් බවද, විනයක් ඇති තැනක් ලෙස මෙය සංවර්ධනය විය යුතු බවද, සඳහන් කළ නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා තානායම ටෙන්ඩර් කිරීම සුදුසු බවද ආදායමක් ලබාගත හැකි ස්ථානයක් ලෙස නීත්‍යානුකූල ලෙස කටයුතු කළ හැකි කළමනාකරුවෙකු පත් කර නව නීතිරීති වලට අනුව කටයුතු කළ හැකි ස්ථානයක් ලෙස සංවර්ධනය කළ යුතු බවද පෙන්වා දෙන ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී ඒ. අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමා.**

පසුගිය කාලයේ තානායමේ සේවය කළ කළමනාකරු නිසා විශාල අලාභයක් සිදු වූ බවද, ලාභ පෙන්වීමට බව පවසා ගරු සභාපතිතුමාගේ පාලනයට ගැනීම සිදු වූ නමුත් නැවතත් පෙර තිබූ අගාධයටම තානායම වැටී ඇති බවද, හිතවතුන්ගේ විවාහ උත්සව අවස්ථා වලදී විශාල ලෙස අක්‍රමිකතා සිදු වී ඇති බව හා එම කරුණු පිළිබඳ විමසීමේදී තමන් අපහසුතාවයන්ට පත්ව බවද, ජනතා මනාපයෙන් පත්වී ඇති නියෝජිතයන් ලෙස ජනතාවට සේවය කිරීම යුතුකමක් බවද එම යුතුකම වගකීම නිසිලෙස ඉටු කිරීම සඳහා තානායම නිසි පරිදි ක්‍රමවේදයකට අනුකූලව කරගෙන යාමට ගරු සභාපතිතුමාගේ සහයෝගය ලබා දෙන ලෙසද ඉල්ලා සිටි ගරු මන්ත්‍රීතුමා අනෙක් බහුතර මන්ත්‍රීවරුන් සේම තමන්ද තානායම ටෙන්ඩර් කිරීම සඳහා ගෙන ආ යෝජනාව ස්ථිර කරන බව දන්වා සිටින ලදි.

**නගර සභා ගරු මන්ත්‍රි චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා.**

තානායම ටෙන්ඩර් කිරීමට පක්ෂව මත පළ වුවද විපක්ෂව මත පළ නොවූ බවද ඒ සඳහා යම් මතයක් පළ කරන ලෙස ද මෙම යෝජනාව සඳහා ඡන්ද විමසීමක් පැවැත්වීම සුදුසු බවට ද යෝජනා කරන ලදි.

**ගරු සභාපතිතුමා**

විවිධාකාරයෙන් චෝදනා එල්ල වුවද මේ වන තෙක් ලිඛිතව සභාවට තානායම වෙනුවෙන් පැමිණිල්ලක් ලැබී නොමැති බවත්, දේශපාලනික අරමුණු වලින් විවිධ පුද්ගලයන් නොයෙක් ප්‍රකාශ සිදු කරන බවද, හිටපු ජනාධිපති තුමන්ට ධූරය අහිමි වූයේ භාණ්ඩ මිල ඉහළ යාම නිසා බවද බඩු මිල ඉහළ යාම, නවාතැන් පොළවල් වැඩි වීම ලාභය අඩු වීමට බලපාන බවද පැවසූ ගරු සභාපතිතුමන් විසින් තානායම ටෙන්ඩර් කිරීම සුදුසුය යන මතයේ තමන් ද සිටි නමුත් ටෙන්ඩර් කිරීම තුළ ටෙන්ඩර්කරුවන්ට නැවත ආයතන ලබාදීමට සිදුවූ අවස්ථා බහුල බවද පෙන්වා දෙන ලදි. පසුගිය අවුරුදු 3 දීම වැටුප් හා වෙනත් වියදම් ගෙවා ලක්ෂ 36 ක ආදායමක් උපයා ඇති බවද, නව ව්‍යාපාර ස්ථාන බොහෝමයක් ඇති වී ඇති නමුත් වසරකට ලක්ෂ 12 ක පමණ ආදායමක් තානායම උපයා ඇති බවද, ඉතා විශාල සේවාවක් තානායමෙන් ලබාගත් බවද, තානායම අසල පදිංචිව සිටින නමුත් එයින් තමන් ආහාරපාන හෝ මත්පැන් ලබා නොගන්නා බවත්, ඉහත චෝදනා අනුව දේශපාලන මුහුණුවරක් ගන්නා බවක් පැහැදිලි වන බවත් ප්‍රකාශ කළ ගරු සභාපතිතුමා විසින් තානායමේ පාලන තන්ත්‍රය වෙනස් කිරීමට අවශ්‍ය යැයි හැගෙන්නේ නම් ඒ සඳහා කටයුතු කළ හැකි බවත්, දැනටත් පාලන කටයුතු වල පුද්ගලයන් දෙදෙනක් නිරත වන අතර ඔවුන් පෙබරවාරි මස සිට සේවයෙන් ඉවත් වීම සඳහා ලිපි සකසා ඇති අතර ඒ පිළිබඳ පළාත් පාලන කොමසාරිස් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සකස් කරන බවත් දන්වා සිටින ලදි.

එසේම අද දින ගත්තා වූ තීරණ පිළිබඳ පලාත් පාළන කොමසාරිස් දැනුවත් කර තානායමේ අවසන් තොගය ගණනය කර ටෙන්ඩර් කිරීමට කටයුතු කරන බව දන්වන ලදි. එසේම ටෙන්ඩර් කරන තෙක් පාලනය නගර සභාවට පැවරීම සුදුසු බවද ප්‍රජා සංවර්ධන නිලධාරීන් සම්බන්ධ කර ගෙන ටෙන්ඩර් කිරීම සඳහා ඉදිරි කටයුතු සිදු කරන බවද ගරු සභාපතිතුමන් විසින් දැනුම් දෙන ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්.රූම් මැතිතුමා**

ටෙන්ඩර් කිරීම සුදුසු බව 5/9 ක බහුතර මතය බැවින් තානායම ටෙන්ඩර් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

බහුතර මතය තානායම ටෙන්ඩර් කිරීම සුදුසු බව වන බැවින් නියමිත පටිපාටිය අනුව තානායම ටෙන්ඩර් කිරීම අනුමත කරන බවද ගරු සභාපතිතුමාගේ නාමයට වැරදි සිදු නොවිය යුතු බවත් දැනට ඇති ගණනය කිරීම් අනුව මසකට තානායම ලබන ආදායම රු. ලක්ෂයක් බැවින් එම ආදායම වැඩි කර ගැනීම සඳහා තානායම ටෙන්ඩර් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

සියළුම මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත තානායම ටෙන්ඩර් කිරීම බවද, ගරු සභාපතිතුමාගේ පුතා නිසා තානායමට ගැටළු මතුව ඇති බවත්, තානායම මේ වන විට දර්ශනීයව ඇති නමුත් බහුතර කැමැත්ත මත ටෙන්ඩර් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

**11:02 නගර සභා ගරු මන්ත්‍රි ඒ. අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමා.**

11:02:01 උඩ ඇල්ලෙපොල, මහමෙව්නා මාවත ප්‍රතිසංස්කරණය සඳහා යෝජනා කිරීම

සභාවේ මුදල් නොමැති බැවින් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ලබාදෙන රු. 1,000,000.00 ක මුදලින් මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කරන ලෙස දන්වන ලදි.

**11:03 නගර සභා ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා.**

11:01:01 වැවේවත්ත ප්‍රජා ශාලාව දේශපාලන රැස්වීම් සඳහා ඉඩ ලබා නොදීමට යෝජනා කිරීම

ගරු සභාපතිතුමන් විසින් ඉහත යෝජනා මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබාදීමට යෝජනා කරන ලදි.

එම යෝජනාව ස්ථිර කළ නගර සභා ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා පහත සඳහන් අදහස් ද පළ කරන ලදි.

දේශපාලනය ගැටලුවක් නොවන බවද නමුත් අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමා සහ එතුමාගේ පියා විසින් වැවේවත්ත ප්‍රජාශාලාවේ රැස්වීමක් පැවැත්වූ බවද, එහිදී බළන්ගොඩ නගර සභාව මගින් වැවේවත්ත ප්‍රදේශයට කිසිදු සංවර්ධනයක් සිදු නොකල බවද හොරුන් පිරිසක් ඇතිවී ඇති බව ද අසංක මැතිතුමාගේ පියා ප්‍රකාශ කළ බව සඳහන් කළ ගරු උපසභාපතිතුමා මෙම රැස්වීම පැවැත්වූයේ තමා මූලික වී ඉදිකළ ප්‍රජා ශාලාවේ සිට බව ද පෙන්වා දෙන ලදි. නමුත් ප්‍රජාතන්ත්‍රවාදීව අදහස් පළ කිරීමට අවස්ථාව තමා නිසා එක්සත් ජාතික පාක්ෂිකයන්ට ලැබුණ බවද ඒ පිළිබඳ සතුටට පත්වන බවද සඳහන් කළ එතුමා නගර සභාවේ මන්ත්‍රීවරු හොරු බවට පත්කිරීම පිළිබඳ කණගාටු වන බවද ඉදිරියට ප්‍රජා ශාලාව දේශපාලන කටයුතු සඳහා ලබා නොදෙන ලෙසද ඉල්ලා සිටින ලදි.

**ගරු සභාපතිතුමා**

පසුගිය වසර 12කට වැඩි කාලයක අයවැය වාර්තා නිරීක්ෂණය කළ විට සිදුකළ සංවර්ධන කටයුතු පිළිබඳ තොරතුරු සොයා ගත හැකි බවත්, සංවර්ධන වැඩ නොකළ අයට එය නොකළ බව ප්‍රකාශ කළ හැකි බවත්, තමන් බලයට පත් වන විට නගර සභාව තුළ හිඳගැනීමට අසුනක්වත් නොතිබූ අතර ඒ සඳහා සාක්ෂි ඇති බවද පැවසූ ගරු සභාපතිතුමා අද දින ගල්රෝලක් ලබාගැනීම සඳහා සාකච්ඡා කළ බවද, මේ වන විට නගර සභාවට අවශ්‍ය සියලුම වාහන, කැබ් රථ, ට්‍රැක්ටර් 10ක්, ජල බවුසර, ගිනිනිවන රථයක් ඇතුලු වාහන රාශියක් ලබාගෙන ඇති බවද රු. 20000 ක ආදායමක් ලැබූ තානායම නගර සභාවේ ආදායම් ලබාගත හැකි දේපළක් ලෙස ලබාදී ඇති බවද, එසේම විශාල ආදායමක් ලබාගත හැකි ලෙෂ ඉරිදා පොළක් සකස්කර ඇති බවද පෙන්වා දෙන ලදි. එසේම බළන්ගොඩ නගරයේ සංවර්ධනය උදෙසා සකස් කළ බස් නැවතුම් පොළ නිරාකරණය කර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් සිටින අතර අද වන විට නගරය ජාත්‍යන්තරය කරා රැගෙන ගොස් ඇති බවද, ඒ සඳහා ලැබූ සම්මාන සාක්ෂි දරණ බවද, 1995 වර්ෂයේ සිට සිදුකළ සංවර්ධන වැඩකටයුතු පිළිබඳ විවේචන මුහුණට මුහුණලා පවසන ලෙසද අභියෝග කළ ගරු සභාපතිතුමා විසින් එහිදී වරදක් සිදුවී ඇත්නම් එය ඔප්පු කළහොත් ජනතාව ඉදිරියේ නින්දා විඳීමට සූදානම් බව මෙන්ම නිකරුනේ දොස් ඇසීමට සූදානම් නැතිබව ද ප්‍රකාශ කරන ලදි. එසේම තුඹගොඩ වසමට තරම් අනෙක් වසම් වලට සංවර්ධනයක් සිදුනොවූ බවද, තමන් බලයට පත්වන විට විදුලි බල්බ 04 ක් තිබූ එම ප්‍රදේශයේ නූතනයේ විදුලි බල්බ 200 කට වැඩි සංඛ්‍යාවක් දක්වා යොදා ඇති බව ද, පාරවල් සකස් කළ අතරම සුසාන භූමියද රමණීය ආකාරයට සකස් කළ බවද, වැවේවත්ත ප්‍රජා ශාලාව විශාල මුදලක් යොදා සකස් කළ බවද එහි ළදරු පාසලක් පවත්වන බවද,

වැවේවත්ත සහ කියුලවෙල වතු නිවාස කඩා තට්ටු 02කට සෑදීමට සාකච්ඡා කර ඇති බවද එහි උප සභාපතිවරයා විසින් පුල්ලමඩුවක් සදා දී ඇති බවද මෙවැනි සංවර්ධන ක්‍රියා රාශියක් සිදුකර ඇති බැවින් දේශපාලන කටයුතු සඳහා ඉදිරියේදී ප්‍රජා ශාලාව ලබා නොදීමට කටයුතු කරන බවද ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා.**

මහජන මුදලින් සකස් කළ දේ මහජන අවශ්‍යතා සඳහා ලබාදිය යුතු බවත්, පොදුජන එක්සත් පෙරමුණෙන්ද එම ප්‍රජා ශාලාවේදී දේශපාලන කටයුතු සිදුකළ බවත්, හොරු යනුවෙන් දෝෂාරෝපණය කිරීම තුළ උපසභාපතිතුමන් කෝපයට පත්ව ඇති බවත්, නගර සභාව සතු දේපල ලේකම් හට නිදහස් කිරීමට බලය ඇති හෙයින් මහජන අවශ්‍යතා සඳහා ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමන් විසින් ඉල්ලා සිටින ලදි. එසේ ම දේශපාලනය යනු මහජනතාව උදෙසා සිදු කරන දෙයක් බවද, පසුගිය කාලසීමාවේ එහි දේශපාලන කටයුතු සිදුකළ අතර ඉහත සඳහන් දේශපාලන රැස්වීම පැවැත්වූ පමණින් ප්‍රජා ශාලාව දේශපාලන කටයුතු සඳහා ලබා නොදීමට තීරණය කිරීම අසාධාරණ බවද පෙන්වා දෙන ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී ඒ. අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමා.**

කිසිවෙකුගේ හෝ වචන වැරදීමක් සිදුව ඇති නමුත් මෙය දේශපාලන රැස්වීමක් නොවන බවද බලන්ගොඩ ජනතාව සමගිව සිටිය යුතු බවද, අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා එම ධූරයට පත් කළ ජනතාවට ස්තූතිය පළ කිරීම සහ එතුමා කරගෙන ගිය මෙහෙවර ජනතාව අතරට ගෙනයාම සඳහා සාකච්ඡාවක් පැවැත්වූ බවද දන්වා සිටින ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික්ෂා මැතිතුමා**

මහජන ඡන්දයක් පැවැත්වෙන අවස්ථාවක මෙවැනි තීරණයක් ගැනීම සුදුසු බවද, අනෙක් අවස්ථාවල පොදු වැඩකටයුතු සඳහා ප්‍රජාශාලාව ලබාදීම සුදුසු බවද, ඉහත පවත්වා ඇත්තේ දේශපාලන රැස්වීමක් නොව ස්තූතිය පළ කිරීමේ අවස්ථාවක් බවද, මහජන දේපළ ජනතාවට අයත් විය යුතු බවද පෙන්වා දෙන ලදි.

## 12. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

### 12:01 මුදල් කාරක සභා වාර්තාව

2015.01.23 වන දින පැවති මුදල් කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්.රූම් මැතිතුමා න් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 12:02 පුස්තකාල උපදේශක කමිටු සභා වාර්තාව

2015.01.19 වන දින පැවති පුස්තකාල උපදේශක කමිටු සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 12:03 කර්මාන්ත හා සංවර්ධන කාරක සභා වාර්තාව

2015.01.22 වන දින පැවති කර්මාන්ත හා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 13. ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම

**13:01 2014 ඔක්තෝම්බර් මාසය සඳහා වන ලැබීම් හා ගෙවීම් විග්‍රහය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 12,686,127.69 |
| වෙනත් ලැබීම් | 6,863,164.90 |
| **මුළු ලැබීම්** | **19,549,292.59** |
| පුනරාවර්තන වියදම් | 12,034,171.70 |
| වෙනත් වියදම් | 6,985,405.35 |
| **මුළු වියදම්** | **19,019,577.05** |

ඉහත වාර්තාව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් ඉදිරිපත් නොවූයෙන් මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**13:02 2014.12.01 සිට 2014.12.31 දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව**

2014.12.01 සිට 2014.12.31 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාලව වාහන සඳහා මුළු ඉන්ධන වියදම රු. 323,583.00 කි.

ඉහත ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර, එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

## 14. වෙනත් කරුණු

14:14 **නගර සභා ගරු මන්ත්‍රි ඒ. අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමා.**

ප්‍රථමයෙන් මෛත්‍රී පාලනයක් ඇති කිරීමට, මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපති කිරීමට හා රනිල් වික්‍රමසිංහ මහතා අගමැති ධූරයට පත් කිරීමට බළන්ගොඩ ආසනයේ හා ප්‍රදේශයේ සහයෝගය ලබාදුන් සැමට ස්තුතිය පළ කළ අතර අතිගරු ජනාධිපතිතුමා බලාපොරොත්තු වන යහපාලනය බලන්ගොඩ ජනතාවට ළගා කරවීම සඳහා නගර සභාවක් ලෙස සැවොම එකතු විය යුතු බවද පසුගිය ආණ්ඩු කාලයේදි ලෙස නොව මෙම ආණ්ඩුවෙන් එක් මන්ත්‍රීවරයෙක් සඳහා රු. ලක්‍ෂ 10ක මුදලක් වෙන්කර දි ඇති බවත්, ඒ සඳහාද ගරු ජනාධිපතිතුමාට හා අගමැතිතුමාට ස්තුතිවන්ත විය යුතු බවත් ගරු මන්ත්‍රීතුමන් විසින් ප්‍රකාශ කරන ලදි. එසේම ඉදිරියේදිද ගරු සභාපතිතුමාට සහයෝගය

ලබාදෙන බව සඳහන් කළ එතුමා තානායමේ තනතුරු වෙනස් කිරීමට බලපෑම් නොකරන බවද නමුත් තානායම නිවැරදි පාලනයකට නතු කරන ලෙස ද ඉල්ලා සිටියේය.

එසේම බළන්ගොඩ එක්සත් ජාතික පක්ෂ ආසන සංවිධායක ලෙස මැතිවරණයට සති කීපයකට පෙර මහජන ක්‍රීඩාංගනය වෙන් කළ නමුත් ඡන්දය ආසන්නයේදී එය ලබාදිය නොහැකි බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දුන් අතර එම අවස්ථාවේදී බලගහමුල ප්‍රදේශය ගරු ජනාධිපතිතුමාගේ මැතිවරණ රැස්වීම සඳහා සකසා ගත් බවත්, එතැනට රැස්වූ විශාල පිරිස නිසා මල්පැළ කීපයක් විනාශ වූ බවට තමාට විරුද්ධව පොලිසියට පැමිණිලි කර ඇති බවද අද දින එම පැමිණිලි විභාග කිරීමට පොලිසියෙන් පැමිණ ඇති බවද ඒ සඳහා කණගාටුව ප්‍රකාශ කරන අතර ජනතාවට සේවය කිරීමේ අරමුණින් කටයුතු කරන බවත් යහපාලනය සඳහා කටයුතු කරන අවස්ථාවේ දී එම පැමිණිල්ල ඉවත්කර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදි. මහජන ක්‍රීඩා පිටිය ලබා දුන්නා නම් කිසිදු ආකාරයේ අලාභයක් සිදු නොවන බවද, ජනතා සේවකයින් වන තමන්ට මෙවැනි අසාධාරණකම් සිදු නොකරන ලෙසද ගරු සභාපතිතුමාගෙන් අවසන් වශයෙන් ඉල්ලා සිටින ලදි.

**14:02 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

රජවරුන්ට වුවද කලකම් පළදෙන බව ද වෙල්ලස්ස කැරැල්ලේදී ලංකාවේ සිටි වීරවරු විනාශ කළ අතර ඒ ලෙසම රට විනාශ කළ පාවාදීමක් 2015 දී ද සිදුවූ බවත් ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා රටට විශාල සංවර්ධනයක් සිදුකළ නමුත් මාධ්‍ය සංදර්ශන වලින් එතුමා සොරෙක් බවට පත් කර ඇති බවත්, නමුත් වැඩි ඡන්ද වලින් බහුතරයෙන් එතුමා ජයග්‍රහණය කළ බවත්, මෙය සංඛ්‍යාත්මකව පරාජයක් වුවත් හෘදසාක්ෂියට අනුව පරාද වීමක් නොවන අතර සොරකම් සිදුවී ඇති නම් කුමන පක්ෂයේ සිටියද ඔවුන්ට දඩුවම් ලබාදිය යුතු බවත්, ඉදිරියේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධාන රජය අතිශය විශාල ජයග්‍රහණයක් ලබාගැනීමට අවශ්‍ය ශක්තිය ලබාදෙන බවත් ගරු සභාපතිතුමාට නිවැරදි ක්‍රියාවන් වලදී ඉදිරියේදීද ශක්තිය සහ සහයෝගය ලබාදෙන බවත් නගර සභාව ජයග්‍රහණය කිරීමට කටයුතු කරන බව ද දන්වා සිටින ලදි. එසේම මහජන පොළ හා තානායම සම්බන්දයෙන් නිවැරදි ලෙස තීන්දු තීරණ ගන්නා ලෙසත් වැරදි අවබෝධ ඇතිකර නොගන්නා ලෙස ද වැඩි දුරටත් ඉල්ලා සිටින ලදි.

**14:03 නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

සියලු දෙනාමට මෛත්‍රිය පතන බවත්, පසුගිය මැතිවරණ පිළිබඳ කතානොකිරීමට බලාපොරොත්තු වූ නමුත් ඒ පිළිබඳ පැවසීම අවශ්‍ය වූ බවත්, හිටපු ජනපති මහින්ද රාජපක්ෂ මහතා මහජනතාව දැඩි ලෙස පීඩනයට පත් කරමින් මැතිවරණය මෙහෙයවූ බවත්, ප්‍රචාරක කටයුතු කිරීමේ දී රූපවාහිනී නාලිකා වැඩි ප්‍රමාණයක් පැවති ආණ්ඩුවට අයත් වූ බවත්, දැඩි දුෂ්කරතා මධ්‍යයේ ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඡන්ද ව්‍යාපාරය ගෙනගිය බවත්, එතුමන් පැවති තත්ත්වය අනුව ලැබූ ජයග්‍රහණය විශිෂ්ඨ බවත්, ඒ සඳහා පක්ෂ කීපයක් සහයෝගය ලබාදුන් බවද, රටක නායකයෙන් වැඩි වසර ගණනක් පාලනයේ නොසිටිය යුතු බවද, පාලනය වෙනස් විය යුතු බවද, එතුළින් රට දියුණුව කරා ගමන් කරන බවද ප්‍රකාශ කර සිටින ලදි.

එසේම සියලුම පක්ෂ යුද්ධය ජයග්‍රහණය කිරීමට විවිධ අවස්ථාවල ක්‍රියාකළ බවත්, 25000 කට වැඩි තරුණ ජීවිත මේ නිසා විනාශ වූ බවද, පසුගිය මැතිවරණයේදී ද්‍රවිඩ පක්ෂ රට දෙකට කිරීමට එක් නොවූ බවද නොයෙක් ප්‍රතිලාභ ජනතාවට ඡන්ද කාලයේදී බෙදාදුන් බවද, මේ නිසා මහින්ද රාජපක්ෂ මහතා 57 ලක්ෂයක ඡන්ද ලබාගත් නමුත් යම් පිරිසක් පමණක් එම රජයෙන් ප්‍රතිලාබ ලැබූ බවත්, බහුතරයකට එම ප්‍රතිලාභ නොලැබූ බවත් සඳහන් කළ ධර්මසේන සමරසිංහ මැතිතුමා මේ වන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන් සියලුම දෙනා නිශ්ශබ්දව සිටින බවද, එබැවින් මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ජයග්‍රහණය ඉතා උතුම් ලෙස දකින බවත්, නිදහස් මැතිවරණයක් වූයේ නම් මීට

වැඩි ඡන්ද සංඛ්‍යාවකින් එතුමන් ජයග්‍රහණය කරන බවත්, මානසිකව මිනිසුන් කඩා දැමූ බවත්, රජයේ සේවකයන් වැඩි පිරිසකගේ මනාපය නව ආණ්ඩුවට ලැබුණේ පසුගිය ආණ්ඩුවේ ක්‍රියා කලාපය නිසා බවත් පෙන්වා දෙන ලදි.

එසේම රු. 10000 ට වැඩි ගෙවීම් වලදී ඩීසල් සඳහා වන ගෙවීම් අනුමත නොකරන බවද, සෞඛ්‍ය අංශයේ වාහන වල නොව අනෙක් වාහන වල ඩීසල් යෙදවීමේ වාර්තා අවශ්‍ය බවත් එය ඉදිරි සභාවාරයේදී ලබා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදි.

14:04 **නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

මෙවර පැවති මැතිවරණය පෙර පැවති මැතිවරණ වලට වඩා ඉතා සාධාරණ මැතිවරණයක් බවද, ඒ නිසා හිටපු ජනාධිපතිවරයාගේ බලය යටතේ වුවද නව ජනාධිපතිවරයෙක් පත් වූ බවද, හිටපු ජනාධිපතිවරයා 30 වසරක යුද්ධය නිමාකර රට එක්සේසත් කළ බැවින් ඉතිහාසගත වන බවද, ඔහු වෙනුවෙන් ඡන්දය ලබාදුන් ලංකාවේ සියලුම ජනතාවට ස්තුතිය පල කරන බවද, සුළුතරයක් විසින් බහුතර මතය පැරදවූ නමුත් නව ජනාධිපතිවරයා යටතේ රට සංවර්ධනය කරා ගෙනයාමට කටයුතු කරන බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා හිටපු ජනපති මහින්ද රාජපක්ෂ මහතාට ඡන්දය ලබාදුන් සැමට ස්තුතිය පළ කරන අතර එතුමාට දීර්ඝායුෂ ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදි.

**14:05 ගරු නාගරික මන්ත්‍රි චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා**

රටේ ඇති වුණ නවමු යුගයේ තොරතුරු වාර්තා කිරීමට නොපැකිලෙන ලෙස හා බියට පත් නොවෙල ලෙස මාධ්‍යවේදීන්ට දන්වන ලද අතර, එක්නැලිගොඩ, ලසන්ත වික්‍රමරත්න වැනි මාධ්‍යවේදීන් සිදුවූ දේ නැවත නොවෙන බව ද දන්වන ලදි. තමන් සහයෝගය දී පත් කර ගත් පක්ෂ භේදයක් නොමැති රටේ ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ පාලනය යටතේ කිසිවෙකුට හිංසා පීඩාවක් නොවෙන බවද සාකච්ඡා වන දේ වාර්තා කිරීමේ දී ගැටලු මතුවීමට ඉඩ නොදෙන බවද වැඩි දුරටත් දන්වන ලදි.

පසුගිය මැතිවරණය පිළිබඳ අදහස් පළ කිරීමට බලාපොරොත්තු නොවූවද නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා පැවසූ ආකාරයට සුළුතරය බහුතරය පරාද කිරීමක් සිදු නොවූ බවද, උතුරේ ද්‍රවිඩ ජනතාවද, නැගෙනහිර මුස්ලිම් ජනතාවද ලංකාවේ පුරවැසියන් බවද මේ ආකාරයට ජාතිවාදීව වර්ගවාදීව බෙදීමක් සිදු නොකරන ලෙසද, එසේම එක්සත් ජාතික පාක්ෂිකයන් විසින් සහයෝගය ලබාදී ජනාධිපති කළ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ දක්ෂතාවය අගය කරන බවද සුළු ජාතීන්ව හෝ ගරු ජනාධිපතිතුමාගේ ජයග්‍රහණය අවතක්සේරු නොකරන ලෙසද, පසුගිය මහින්ද රාජපක්ෂ සමයේදී තිබූ පීඩනය නිසා තමන් දේශපාලනයෙන් ඉවත් වීමට සූදානමක් තිබූ බවද සංවේදී මිනිසුන් ලෙස දැඩි පීඩනයක් තිබූ බවද සඳහන් කළ ගරු මන්ත්‍රීතුමන් විසින් ඉදිරි අනාගතය සියල්ලටම සහයෝගයෙන් විශ්වාසයෙන් වැඩකටයුතු කළ හැකි සමාජයන් නිර්මාණය වන බවද පෙන්වා දෙන ලදි.

එසේම ශ්‍රී ලංකාවාසී මෙන්ම බළන්ගොඩ වාසී සියළු ජනතාවට මෙම සභාවේ සියල්ලන්ටමත් යහපත් ජාතික නායකත්වයක් ඇතිකර ගැනීමට ඡන්දය ලබාදී රූපවාහිනී ගුවන් විදුලි නාලිකාවල අසන්න දකින්න ලැබෙන දේවල් අනුව මාර පරාජයක් සිදු කර බවද, දේශපාලකයින් ලෙස කුහකකමක් නොමැති අතර පසුගිය ජනාධිපතිවරණ සමයේ ක්‍රියාත්මක කළ හා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ දේ අනුව ගරු කටයුතු පුද්ගලයෙක් වූ හිටපු ජනාධිපතිතුමා පරාජය වීම අනුමත කරන බවද, එසේම මැතිවරණ සමයේ නගර සභාවේ රථවාහන දේශපාලන හා මැතිවරණ කටයුතු සඳහා භාවිතා කළ බවද ඒවා ජනතා බදු මුදලින් නඩත්තු වන බැවින් 227-7521 - ටිපර් රථය, 56-1906 කෘෂ කැබ් රථය, ND 5124 - වෑන් රථය හා PF 4006 ඩබල් කැබ් රථය වෙනුවෙන් වැය කළ ඉන්ධන සඳහා ගෙවීම් කිරීම අනුමත නොකරන බවද, 2014-12-01 සිට 2014-12-31 දක්වා

මාසයේ කැබ් රථයේ ඉන්ධන වියදම සඳහන් නොවන බවද, ගොඩනැගිලි ද්‍රව්‍ය ඇණවුම් කිරීමේදී වැලි ලබා දීමේ සැපයුම්කරු ලියාපදිංචි වී නොමැති නමුත් දැනට දැනගැනීමට ලැබී ඇති ආකාරයට රු. 6900 ට තිබූ ටෙන්ඩර් අයිතිය රු. 7200ට ලබාගෙන නගර සභාවේ ටිපර් රථයෙන් රහසිගතව වැලි ප්‍රවාහනය කරන බවට සාක්ෂි ලැබී ඇති බවද ප්‍රකාශ කරන ලදි. ඒ සඳහා ද තම විරෝධය පල කරන බව ගරු නගර සභා මන්ත්‍රී තුමා විසින් දන්වන ලදි. කලින් ප්‍රවාහන ගාස්තු සමග අඩු මිලට ලබාගත් වැලි මෙසේ වැඩි මිලට ලබාගැනීම අනුමත නොකරන බවද, එසේම බළන්ගොඩ නගර සභාවට අයත් තාර බැරල් 39ක ගැටළුවක් මතුව ඇති බව දැනගැන්මට ලැබූ බවද මෙවැනි ගැටළු විසඳාගෙන ඉදිරියේදී ගැටළු පැන නොනගින සේ නිවැරදි ගමනක් යායුතු බවද මෙවැනි ගැටළු පිළිබඳ තොරතුරු උසස් නිලධාරීන් ඉල්ලනු ලැබූවද නගර සභාවේ සියල්ලන්ම සහෝදරයන් ලෙස බැඳී ඇති බැවින් යහපාලනයක් උදෙසා අතිගරු ජනාධිපතිතුමා සමග නිවැරදි ගමනක් යාමට මෙන්ම නගරය ගම රට සංවර්ධනය කරා ගෙනයාමට එක්වන ලෙස ඉල්ලමින් සැමට සුභ නව වසරක් පතමින් ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමන් විසින් තම කතාව අවසන් කරන ලදි.

## 15. අවසානය

**ගරු සභාපති ඩබ්ලිව්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

අසංක විජයසිංහ මැතිතුමා ප්‍රකාශ කළ ආකාරයට ඔවුන් ක්‍රීඩා පිටිය අවශ්‍ය බව දැන්වූ අවස්ථාවේ එය ලබා දුන් නමුත් හිටපු ජනාධිපතිතුමා බළන්ගොඩට පැමිණෙන බව දැන්වූ හෙයින් ආරක්‍ෂා කටයුතු සඳහා නැවත ක්‍රීඩා පිටිය ලබාදීම අත්හිටුවීමට සිදුවූ බවද, එසේම එතුමා සඳහන් කළ පරිදි මල් පෝච්චි සම්බන්ධ ගැටළුවේදී නගර සභාව සතු දේපලක් වන බැවින් හා එම මල් සඳහා අධික වියදමක් දැරීමට සිදුවූ හෙයින් සිදු වූ අලාභය රු. 25000 ක් වන බවද, එම මල් පැල සඳහා අලාභහානි කළ පුද්ගලයන් හඳුනාගැනීමට නොහැකි වන නිසා එම රැළිය සංවිධානය කළ අයගෙන් රජයේ දේපළවලට වූ අලාභය අයකර ගත නිසා මෙලෙස පැමිණිල්ලක් කිරීමට සිදු වූ බවද ගරු සභාපතිතුමා විසින් පෙන්වා දෙන ලදි.

එසේම වැලි සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කර නොමැති බවද, පරීක්‍ෂා කිරීම සඳහා වැලි කියුබ් 03 ක් ලබාගත් නමුත් ඒ සඳහා ගෙවීම් කර නොමැති බවද වැලි ප්‍රවාහන මිල නොමැතිව වැලි වල මිල අනුව ලබාගැනීම සඳහා අත්හදාබැලීමක් කළ බවද, කොන්ත්‍රාත්කරුවන්ට ලබා දුන් තාර වෙනුවෙන් ඔවුන්ගේ වව්චර් වලින් මුදල් අයකර ගන්නා බවද, වැරදි තොරතුරු මත ක්‍රියා නොකරන ලෙස ද, කැබ් රථය මැතිවරණ කටයුතු සඳහා නොව ගරු සභාපතිතුමාගේ වැඩකටයුතු සඳහා භාවිතා කරන බවද එතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

මැතිවරණයෙන් කවුරුන් ජයග්‍රහණය කළද අවශ්‍ය වන්නේ රට සංවර්ධනය වීම, භාණ්ඩ මිල අඩුවීම, රැකියා අවස්ථා උදාවීම, ජනතාවට එක්වන්ව ජීවත් වීමේ අයිතිය ලැබීම බවද, නමුත් ඉදිරියේදී පැවැත්වෙන මැතිවරණ වලදී ඉදිරිපත් වෙමින් විශිෂ්ඨ ජයග්‍රහණයක් කරා ගමන් කරන බවද, අග්‍රාමාත්‍යවරයා හා කැබිනට් මණ්ඩලය පත්වීම ව්‍යවස්ථා විරෝධී වන අතර ආණ්ඩුවට බහුතර බලයක් නොමැති බවත් වැඩි කාලයක් මෙම ආණ්ඩුව නොපවතින බවත් දින 100 වැඩපිළිවල ඉදිරියට ගෙනයාම සඳහා ඉල්ලන ලද සහයෝගය ලබාදෙන බවත්, ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂයේ සභාපතිවරයා ලෙස ගරු ජනාධිපතිතුමා නැවත ජයග්‍රහණය කරවමින් ජනතා සේවයට කැපවන බව සඳහන් කරමින් ගතවූ කාලයේදී සිදුවූ අපහසුතා පිළිබඳ කණගාටුව පළ කරමින් ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ කටයුතු ප. ව. 4.15 ට අවසන් කරන ලදී.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.